

සහකාර කථිකාචාර්ය අසිත මල්ලවආරච්චි
ජනසන්නිවේදන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

# ජාත්‍යන්තර අභියෝග හමුවේ දේශීය මුද්‍රිත මාධ්‍යයන්ගේ හැසිරීම

ජනමාධ්‍ය යනු තොරතුරු මත රඳා පවතින්නා වූ වපසරියක ගොඩනැගෙන්නා වූ ව්‍යුහාත්මක පද්ධතියකි. එහිදී මාධ්‍යය තුළින් ඉදිරිපත් කෙරෙන තොරතුරු රැස් කිරීමේදී ඒවා බෙදා හැරීමේදී ඉතා විශ්වසනීය අයුරින් හා වගකීමෙන් යුක්තව කටයුතු කිරීමට ජනමාධ්‍ය බැඳී සිටී. මෙහිදී තොරතුරු වාර්තාකරණය පිළිබඳ තුලනාත්මක විග්‍රහයන් සිදු කිරීමේදී යුදමය තොරතුරු පිළිබඳව දැනගැනීමටත් ඒ පිළිබඳව විමසිලිමත් වීමටත් නිරන්තර කුතුහලයකින් මහජනතාව පෙළෙන අතරම ඔවුන් කරා තොරතුරු ගෙන යාමේදී ජනමාධ්‍ය අතිවිශාල කාර්යභාර්යයක් සිදු කරනු ලැබේ.

සමාජයේ සිදුවන සිද්ධීන්, ක්‍රියාවලීන් පිළිබඳව පරාවර්තනයන් ජනමාධ්‍ය තුළින් දැකගත හැකි අතර ඒවා විනිවිද යෑමේ හැකියාව ජනමාධ්‍ය සතු ප්‍රබලතාවයකි. ඒ අනුව ජනමාධ්‍ය බහුවිෂයික සබඳතා දක්වන ලද බැව් අපට ප්‍රත්‍යක්ෂ වේ. මේ අනුව ගොඩනගන්නා වූ නොයෙකුත් මතවාද ආකල්ප හා දෘෂ්ටීන් සමාජගත වේ. නමුදු මෙවැනි දේ සමාජය තුළ ස්ථාපිත වන්නේත්, ඒවායේ පදනම තීරණය වන්නේත් තොරතුරු මූලාශ්‍රයන්ගේ පවතින්නා වූ ස්වරූප අනුවයි. ලබාදෙන්නා වූ තොරතුරුවල ප්‍රබලතාවය මත මහජනතාව තුළ කුතුහලයන් ගොඩ නැගීම නවතාලිය නොහැක.

ශ්‍රී ලංකාවට ජාත්‍යන්තරය විසින් යුද අපරාධ සිදු කළ බවට චෝදනා එල්ලවන කාලපරිච්ඡේදයක දී බහුවිධ මාධ්‍ය ඉතාමත්ම ප්‍රබලව තම කාර්යභාරය ඉටුකළ යුතුය. එහිදි විද්‍යුත් මාධ්‍යය මෙන්ම මුද්‍රිත මාධ්‍ය ප්‍රධාන වේ. මාධ්‍ය වගකීම කෙසේ හෝ ඉටු කරමින් මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමට උත්සාහ කළ යුතුය. එම උත්සාහය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් මෙම ලිපිය ඔස්සේ සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ යුද අපරාධ සිදු වූ බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ජාත්‍යන්තර මතවාද ස්ථාපිත කිරීම හා ජනමාධ්‍යයේ හැසිරීම පිළිබඳව විමසා බැලීම මෙහිදි සිදු වේ. ශ්‍රී ලංකාවේ යුද අපරාධ සිදු වූ බවට ජාත්‍යන්තර මතවාද ස්ථාපිත කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් පත්කළ විද්වත් මණ්ඩලයේ උපදේශන වාර්තාවට එරෙහිව ලාංකීය පුවත්පත් මාධ්‍ය හැසිරීම පිළිබඳව මෙහිදි විමසා බැලිය හැක. එහිදී පුවත්පත් මාධ්‍ය කටයුතු කරන ආකාරය ප්‍රධාන ආකාර දෙකකට සිදු වේ. එනම්,

I. ජාතික වශයෙන් කටයුතු කරන ආකාරය.

II. ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන ආකාරය.

බෑන් කී මූන් විසින් පත් කරන ලද උපදේශන කමිටුවේ වාර්තාවට අනුව ලාංකීය මුද්‍රිත මාධ්‍යයේ හැසිරීම විමර්ශනය කිරීමේදී ප්‍රධාන වශයෙන් පුවත්පත් 03 ක් තෝරා ගන්නා ලදී. එනම්,

I. ලංකාදීප.

II. දිවයින.

III. දිනමිණ.

යන පුවත්පත් ත්‍රිත්වයයි.

සෑම සමාජයකට තොරතුරු දාම ක්‍රියාත්මකව පවති. එවැනි දාම අවශ්‍ය වන්නේ චාරිත්‍රයක් වශයෙන් හෝ උපායක් වශයෙන් හෝ දැනුම ව්‍යාප්ත කිරීමට ය. මධ්‍යතන යුගයේ අගභාගයේදී පමණ බටහිර ලෝකයේ මුද්‍රිත ස්වරූපය පදනම් කරගෙන ප්‍රවෘත්ති පත්‍ර බිහිවිය. සමාජ පැවැත්මේ ප්‍රධාන බන්ධනයක් වූ පුවත්පත වැදගත් භූමිකාවක් රඟපාන්නට වූයේ ප්‍රධාන පාර්ශව දෙකක් ද උපකාරයට ගනිමිනි. එනම්,

– ග්‍රාහකයින්

– තොරතුරු

පුවත්පතක් යනු සමාන අන්තරවලින් යුත් කාල සීමාවන් හි මුද්‍රණයට පත් කර එළි දක්වන ප්‍රකාශනයකි. එහි ප්‍රධාන අරමුණ වන්නේ පාඨකයාට පුවත් ලබා දීමයි. කිසියම් පුවත්පතකින් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට ද පුවත්පත් මගින් උත්සාහ දරයි. කෙසේ වුවද ලෝකය පිළිබඳ අපේ දෘෂ්ටිය සකස් කරන්නේ ජනමාධ්‍ය මඟිනි. ජනමාධ්‍යයේ ආරක්ෂක මුරදේවතා (Watch Dog Function) කාර්යය එලෙසම ඉටුවේද? සමාජයේ සැබෑ ස්වරූපය වසන් කිරීම සඳහා මතවාදී වාතාවරණයක් සකස් කිරීමට ජනමාධ්‍ය මඟින් උදව් කරන්නේද? මතවාදීකරණය (Ideologizing) වෙනත් චින්තනමය ක්‍රියාවලීන් මෙන් සිතින් මවා ගැනීමක් නිසා, අපි විසින් සිතේ මවා ගන්නා ප්‍රබන්ධ සැබෑ ලෝකයට ඔබ්බ වන්නට අප උත්සාහ කරනවාද? යන්න විමසා බැලිය යුතු ය. ජනමාධ්‍ය මඟින් අපට දිනපතා ලැබෙන ප්‍රවෘත්ති හා අප මුහුණ දෙන යථාර්තය අතර පරතරයක් ඉපදෙන අවස්ථාවලදී, මාධ්‍යය මඟින් ප්‍රවෘත්ති විකෘති කරන්නේය, යන හැඟීම මුල් බැස ගනී.

සංකීර්ණ ශිෂ්ටාචාරයක තිර පැවැත්ම සඳහා අතිශයින් වැදගත් වන තොරතුරු, ප්‍රවෘත්ති අලෙවි කරගත හැකි වෙළඳ භාණ්ඩයකි. මාධ්‍යයකින් සිදු කෙරෙන්නේ ප්‍රවෘත්ති වාර්තා කිරීම, අර්ථ කතනය කිරීම හෝ මත ප්‍රකාශ කිරීමයි. සමාජයේ පවත්නා අනෙක් බලවේග සමාජීය, දේශපාලනික, සමාජ විද්‍යාත්මක සංසිද්ධීන් සමඟ ප්‍රවෘත්ති එකිනෙකට බද්ධ වේ. ඒ නිසා ප්‍රවෘත්ති මාර්ගයෙන් ආවරණය වන ක්ෂේත්‍රය අති විශාලය. එහිදී රටක සිදුවන ජාතික ගැටළුවක් හමුවේ ජනමාධ්‍යයේ වේගවත් ක්‍රියාකාරිත්වය ඉතාමත් වැදගත් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවට යුද අපරාධ චෝදනාව එල්ල වීම තුළ මාධ්‍යය හැසිරීම අධ්‍යයනය කිරීමේදී පුවත්පත්වල ප්‍රවෘත්ති වාර්තාකරණය ප්‍රධාන මිනුම් දණ්ඩක් ලෙස සැලකිය හැක.

එක්සත් ජාතින්ගේ සංවිධානයේ මහ ලේකම්වරයාට උපදෙස් දීම පිණිස කමිටුවක් පත් කරනු ලබන්නේ 2010 සැප්තැම්බර් මස ය. 2010 සැප්තැම්බර් 16 වන දින සිට නිල වශයෙන් එම කමිටුව සිය කටයුතු ක්‍රියාත්මක කර ලදී. මූලික පර්යේෂණ පිළිබඳව විද්වත් මණ්ඩලය ලංකාවට පැමිණීමට නියමිතව පැවතියේ ජනවාරි මාසයේ ය. ඒ අනුව, "බෑන් කී මූන්ගේ විද්වත් මණ්ඩලයේ මෙරටට පැමිණීම සම්බන්ධව ජනවාරි 07 වැනිදාට පෙර ශ්‍රී ලංකාවට දන්වන බව එම මණ්ඩලයේ බලධාරීන් දක්වා ඇත"(http://www.divaina.com/2011/01/04/news31.html&) මේ ආකාරයට විද්වත් මණ්ඩලය ලංකාවට පැමිණෙන බව දිවයින පුවත්පත වාර්තා කළත්, ඒ පිළිබඳ නිරවුල් ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට ලාංකීය පුවත්පත් සමත් වූයේ නැත. එයට පැහැදිලි හේතුවක් ලෙස දකින්නේ විද්වත් කමිටුව විසින් නිශ්චිතව තීරණයක් වාර්තා කර නොතිබීමයි.

ලංකාවට යුද අපරාධ චෝදනාව ඉදිරිපත් කරනු ලබන්නේ විද්වත් කමිටු වාර්තාව විසින් ය. මෙම වාර්තාව සකස් කරනු ලබන්නේ කවදා සිට දැයි නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක. නමුත් එම වාර්තාව මහලේකම්ට ඉදිරිපත් කරන්නේ 2011 අප්‍රේල් 13 වන දිනය.

## LLRC වාර්තාව.

ශ්‍රී ලංකා ආණ්ඩුව යුද්ධයේ අවසාන අදියරයන් පිළිබඳව මේ වන තෙක් දක්වන මතයට වඩා වෙනස් මතයක් දරුස්මාන්ගේ ත්‍රි පුද්ගල කමිටු මණ්ඩලයට ලැබුණු විශ්වාසනීය චෝදනා මගින් හෙළිදරව් වේ. නමුත් ආණ්ඩුව ප්‍රකාශ කරන්නේ ඊට ප්‍රතිවිරුද්ධ ප්‍රකාශයකි. "එය සිවිල් අනතුරු රහිත කිරීමේ ප්‍රතිපත්තිය මත ගෙන ගිය මානුෂීය මුදා ගැනීමේ මෙහෙයුමක් බවය. තමන් කරගෙන ගියේ සිවිල් වැසියන්ට කිසිදු හානියක් නොකිරීමේ ප්‍රතිපත්තිය පදනම් කරගත් මානුෂීය මෙහෙයුමක් බව ආණ්ඩුව පවසයි" (http://wikalpa.org/.?p=6406). නමුත් කමිටුව ශ්‍රී ලංකා ආණ්ඩුව මෙන්ම එල්.ටී.ටී.ඊ ය ද ඉතා විශාල ලෙස ජාත්‍යන්තර මානුෂීය නීතිය හා ජාත්‍යන්තර මානව අයිතීන් පිළිබඳ නීති උල්ලංඝනය කර ඇති බවට එම වාර්තාවේ සඳහන් වේ. මෙයින් සමහරක් යුද අපරාධ හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස ගත හැකිය. මේ අනුව අපිට මහ ලේකම්වරයා පත් කළ විශේෂඥ මණ්ඩලයේ කටයුතුවල රාමුව විමසා බැලීමට පුලුවන. "යුද්ධයේ අවසන් අදියරවලින් පැන නගින වගවීම පිළිබඳ බැඳීම් අවබෝධ කර ගැනීම සඳහා, විෂය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවය පරිදි 'චූදිත උල්ලංඝනයන්හි ස්වභාවය සහ පරිමාණය' පිළිබඳව තක්සේරුවක් කිරීමට මණ්ඩලයට පැවරිනි. කෙසේ වුවද මණ්ඩලය සතු විධි නියෝගය කරුණු සෙවීම හෝ පරීක්ෂණ පැවැත්වීම දක්වා පැතිරෙන්නක් නොවේ.............. මෙම වාර්තාව තුළදී චෝදනා විශ්වසනීය යැයි සැලකෙන්නේ ඒවා අදාල සහ විශ්වාසවන්ත යැයි මණ්ඩලය කල්පනා කරන මූලික මූලාශ්‍රවලින් ලැබුණු අවස්ථාවල පමණකි" (http://vikalpa.org/?p=6406).

මෙම නීතිමය තක්සේරුව තුළදී මණ්ඩලය සිය කටයුතු ආරම්භ කළේ දිගු කාලයක් තිස්සේ තහවුරුව පවතින ජාත්‍යන්තර නීතියේ අවශ්‍යතාවය මතය. එනම්, ශ්‍රී ලංකාව තුළ සිදු වූ සන්නද්ධ ගැටුම අතරතුර දී ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යන දෙකම අදාල වන්නේ ය යන පදනම මත ය. යුද්ධය තුළ මූලික ක්‍රියාකාරකයන් වූ දෙමළ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ) සංවිධානය සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව යන දෙපාර්ශවයටම සම්බන්ධ විශ්වසනීය චෝදනාවලට මණ්ඩලය ජාත්‍යන්තර මානුෂීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ නියමයන් අදාල කර ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුව වගවීම සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති ප්‍රවිෂ්ටයන් අදාළ දේශීය ප්‍රතිපත්ති, වැඩ පිළිවෙලවල් සහ ආයතන තක්සේරු කිරීමේදී ද සහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු සිය නිර්දේශ සකස් කිරීමේදී ද මණ්ඩලය පදනම ලෙස යොදා ගෙන තිබෙන්නේ මෙම රාමුවයි. මෙහිදී විශේෂයෙන්ම ප්‍රකාශ කළ හැක්කේ ශ්‍රී ලංකාව තුළ දිගු කලක් පැවති සන්නද්ධ ගැටුම් තුළ දී දෙපාර්ශවයම කළ ක්‍රියාවන් හේතුකොට ගෙන හටගත් ඛේදනීය ප්‍රතිවිපාකවලින් පීඩා විඳි ගොදුරු වූවන්ගේ අයිතිවාසිකම්වලට සහ අවශ්‍යතාවයන්ට මණ්ඩලය ප්‍රමුඛතාව දී ඇති බවයි. එහිදී විශේෂයෙන්ම ස්ත්‍රීන්, ළමුන් සහ වයස්ගත පුද්ගලයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. "විශේෂයෙන්ම විශ්වසනීය චෝදනා මණ්ඩලයට හමුවිය. යුද්ධයේ අවසාන අදියර සම්බන්ධයෙන් වූ 2008 සැප්තැම්බර් සිට 2009 මැයි 19 දින දක්වා අතර කාලය තුළ දී ශ්‍රී ලංකා හමුදාව ඔවුන්ගේ යුද පෙරමුණ වන්නිය දක්වා ඉදිරියට ගෙන ගිය අතර මහා පරිමාණයේ ෂෙල් වෙඩි ප්‍රහාර හේතුවෙන් විශාල සිවිල් මරණ සංඛ්‍යාවක් සිදු වුණි" (http://www.lankatryth.com).

මේ අනුව සලකා බලන විට ලංකාවේ පැවති යුද්ධයේදී යුද අපරාධ සිදු කළ බවට තොරතුරු ඉදිරිපත් කරමින් වාර්තාව සකස් කොට ඇත. විශේෂයෙන්ම මෙහිදී මණ්ඩලය සොයාගෙන ඇත්තේ යුද්ධයේ අවසන් අදියරවල සම්බන්ධ විශ්වසනීය චෝදනාවන් ය. එය වාර්තාවේ සඳහන් කොට ඇත්තේ මෙසේය. "2008 සැප්තැම්බර් සහ 2009 මැයි 19 දින දක්වා අතරතුරදී ශ්‍රී ලංකා යුද හමුදාව වන්නිය තුළට සිය මිලිටරි මෙහෙයුම ව්‍යාප්ත කළේ සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවකට මරු කැඳවමින් මහා පරිමාණ සහ පුළුල්ව පැතිරි ෂෙල් වෙඩි ප්‍රහාර යොදා ගනිමිනි. 330,000 ක් පමණ සිවිල් වැසියෝ නිරන්තරයෙන් කුඩා වෙමින් පැවති ප්‍රදේශයක් තුළ කොටු වූහ. ෂෙල් වෙඩි වලින් බේරී පලා ගිය ද ඔවුහු එල්.ටී.ටී.ඊ යේ ප්‍රාණ ඇපකරුවන් බවට පත් වූහ. මාධ්‍යය සහ යුද්ධය විවේචනය කළ අනෙක් අය බිය ගැන්වීමට සහ නිහඬ කිරීමට ආණ්ඩුව උත්සාහ ගත්තේ ය. එය පුද්ගලයන් පැහැර ගැනීම සහ අතුරුදහන් කිරීම සඳහා සුදු වෑන් යොදා ගැනීම ඇතුලු විවිධ තර්ජන සහ ක්‍රියාවන් උපයෝගී කර ගත්තේය............" (http://vikalpa.org/?p=6406).

ඒ අනුව කමිටුව විසින් රජයට විශාල චෝදනා ප්‍රමාණයක් එල්ල කර ඇත. මෙහිදී ආණ්ඩුව තුවාල ලැබූවන් හා මරණයෙන් බේරීමට හැකි වූවත් යුදමය කලාපය අතහැර ගිය සඳු තව දුරටත්

පීඩාවට පත් කළේය. එල්.ටී.ටී.ඊ. සැකකරුවන් සෙවීම සඳහා වූ පරීක්ෂා කිරීම කිසිම විනිවිද භාවයකින් හෝ බාහිර නිරීක්ෂණයකින් තොරව සිදු විය. වෙන් කරනු ලැබූ සමහරෙක් වහාම මැරූ බවට වාර්තාවේ සඳහන් කොට ඇත. මෙසේ නිරීක්ෂණය අවසානයේදී ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කරන ලදැයි විශ්වාස කළ හැකි තදබල උල්ලංඝන වර්ග පහක් මණ්ඩලයට සොයා ගැනීමට හැකි වී ඇත. ඒවා නම්,

I. විශාල ලෙස සිදු කළ ෂෙල් ප්‍රහාර මඟින් සිවිල් ජනතාව මරණයට පත් කිරීම.
II. ආරෝග්‍යශාලා හා මානුෂීය සහන සේවා ස්ථානවලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම.
III. මානුෂීය ආධාර දීම වළක්වා ලීම.
IV. ගැටුමට ගොදුරු වූ හා ඉතිරි වූ අයගේ මෙන්ම සරණාගතයන් හා එල්.ටී.ටී.ඊ ක්‍රියාකාරින්ගේ මානව අයිතීන් උල්ලංඝනය කිරීම.
V. ගැටුම් ප්‍රදේශවලින් පිටත විශේෂයෙන්ම මාධ්‍යයට හා ආණ්ඩුව විවේචනය කරන්නට විරුද්ධව සිදු වූ මානව අයිතීන් උල්ලංඝන" (Report of the secretary General's Panel, 2011).

කමිටුව ශ්‍රී ලංකා රජයට චෝදනා කරන ආකාරයටම එල්.ටී.ටී.ඊ යට ද අපරාධ හා ජාත්‍යන්තර මානුෂිය නීතිය උල්ලංඝනය වු අවස්ථා වාර්තාවේ දක්වා ඇත. එමෙන්ම යුද්ධයේ අවසන් අදියරවලට සම්බන්ධ එල්.ටී.ටී.ඊ යට එරෙහිව විශ්වසනීය චෝදනා බවට මණ්ඩලය කළ තීරණය නිසා බරපතල උල්ලංඝනයන් ලෙස සැලකිය හැකි ප්‍රධාන ප්‍රභේද කිහිපයක් වාර්තාවේ සඳහන් කොට ඇත. එනම්,

I. සිවිල් ජනතාව පළිහක් ලෙස භාවිතා කිරීම.
II. එල්.ටී.ටී.ඊ පාලන ප්‍රදේශවලින් මිදී යන සිවිල් ජනතාව ඝාතනය කිරීම.
III. සිවිල් ජනතාව රැස්වෙන ස්ථානවලට කිට්ටුව සිට යුද උපකරණ භාවිතා කිරීම.
IV. ළමයින් බලයෙන් හමුදාවට බඳවා ගැනීම.
V. බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම.
VI. මරාගෙන මැරෙන ප්‍රහාර මඟින් සිවිල් ජනතාව ඝාතනය කිරීම. (Report of the secretary General's Panel, 2011).

දරුස්මාන්ගේ ත්‍රි පුද්ගල කමිටුව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට වගවිය යුතු ආකාරය පිළිබඳව ද වාර්තාව ඉදිරිපත් කර ඇත. ජාත්‍යන්තර මානුෂීය හෝ මානව හිමිකම් නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වගවීම යනු තෝරා ගැනීමක් හෝ ප්‍රතිපත්තියක් පිළිබඳ කාරණාවක් නොවේ. එය දේශීය මෙන්ම ජාත්‍යන්තර නීතිය යටතේ ඉටු කළ යුතු වගකීමකි. විශ්වසනීය ලෙස චූදිත මෙම උල්ලංඝනය කිරීම් බැරෑරුම් පරීක්ෂණයක ද වගකිව යුත්තන්ට එරෙහිව නඩු පැවරීමේ ද අවශ්‍යතාව මතු කරයි. ඔප්පු වුවහොත් ශ්‍රී ලංකාවේ හමුදාපතිවරුන් සහ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් මෙන්ම එල්.ටී.ටී.ඊ යේ මිලිටරි සහ සිවිල් නායකයින් ඇතුළු වඩාත් ම වගකිව යුතු අය ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් අපරාධ වගකීම දරණු ඇත. එමෙන්ම මෙම වගවීම එම සීමාව තුළ පවතින්නක් නොව, මෙලෙස සිදුකර ඇති අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමෙන් සහ එම අපරාධ වලට එරෙහිව නඩු පැවරීමෙන් ඔබ්බට ද වගවීම ව්‍යාප්ත වෙයි.

**ලාංකීය පුවත්පත් මධ්‍ය හැසිරීම**

LLRC වාර්තාව 2011 අප්‍රේල් 23 වන දින නිල වශයෙන් ප්‍රකාශයට පත් කර මාධ්‍යයට ඉදිරිපත් කර ඇත. මේ ආකාරයට කමිටු වාර්තාව මාධ්‍යයට ඉදිරිපත් කිරීම ඔස්සේ ලාංකීය මුද්‍රිත මාධ්‍යයයෙහි වැඩි පැහුරුවක් ඒ කෙරෙහි යොමු වූ බැව් ප්‍රකාශ කළ හැක. එම කාරණාව ප්‍රත්‍යක්ෂ වන්නේ 2011 අප්‍රේල් මාසයේ සිට ඒ පිළිබඳ ප්‍රවෘත්ති වාර්තා කිරීම වැඩි වූ හෙයින් ය. එමෙන්ම විශේෂාංග ද එකින් එක ගෙන බලන විට ඒවා වර්ග කිහිපයක් යටතේ වර්ග කිරීමට පුළුවන. ඒවා අතර,

1. විද්වත් කමිටු වාර්තාවට අදාල ප්‍රවෘත්ති පදනම් කරගත් විශ්ලේෂණ.
2. කමිටු සාමාජිකයන් හා බැන් කී මූන් වෙත යොමුවූ විශ්ලේෂණ.
3. කමිටු වාර්තාව පිළිබඳ දේශපාලඥයින් දරන මතය පදනම් කරගත් විශ්ලේෂණ.
4. කමිටු වාර්තාව පිළිබඳව විද්වත් පිරිස් දරන මතය පදනම් කරගත් විශ්ලේෂණ

ආදී වශයෙන් දැක්විය හැක. පුවත්පත කර්තෘ වාක්‍යයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මන්ද පුවත්පතක ගමන් දෘෂ්ටිය කර්තෘ වාක්‍යය තුළින් හෙළිදරව් වීම හේතු කොට ගෙනය. ඒ අනුව දරුස්මාන් කමිටුවේ ක්‍රියාකාරිත්වය අනුව දේශීය ජනමාධ්‍යයේ හැසිරීම අධ්‍යයනය කිරීමේදී පුවත්පත් තුළ එන කතුවැකිය සුවිශේෂ හෙයින් උක්ත කාරණාවට අදාලව ලියවෙන කර්තෘ වාක්‍ය ද අධ්‍යයනයට හසු කර ගත හැක. හුදෙක් කමිටුව පත්කිරීම හෝ, කමිටුව ලංකාවට පැමිණීම හෝ කමිටුව ලංකාව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව හෝ මාධ්‍ය විමර්ශනය කිරීමට වඩා පුළුල් අවධානයක් කමිටු වාර්තාව මාධ්‍යයට නිකුත් කිරීමත් සමඟ යොමු කර ඇති බව පෙනී යයි. විශේෂයෙන්ම ද්‍රවිඩ ඩයස්පෝරාව ක්‍රියාත්මක වීමත් සමඟම දේශීය ජනමාධ්‍යය ප්‍රබල නැඹුරුවක් ඒ කෙරෙහි යොමු කර ඇත.

ප්‍රවෘත්ති, විශ්ලේෂණ, කර්තෘ වාක්‍යවලට අමතරව කාටූන් කෙරෙහිද අවධානය යොමුකළ හැකිය. කාටූන් මඟින් සමාජය පිළිබඳව බහුතරයේ අවධානය යොමු කර ඔවුන්ගේ චින්තනයේ වෙනසක් ඇති කරලීමේ හැකියාව ඇත. කාටූන් ශිල්පියෙකුට ඒකාධිපති පාලනයක් ඇති තැන්වල පවා ඉතාමත් සූක්ෂම අන්දමට රටේ පාලනය විවේචනය කිරීමට පුළුවන. එම නිසා විද්වත් මණ්ඩලයේ කමිටු වාර්තාවට අදාලව පුවත්පත් මාධ්‍යයේ හැසිරීම විමසා බැලීමේදී කාටූන් මඟින් ප්‍රබල අවධානයක් පාඨකයා කෙරෙහි යොමු කිරීමට ගත් උත්සාහය පිළිබඳව විමසා බැලීම වැදගත් වේ. මෙම සියලු දත්තයන් පිළිබඳව සැළකිලිමත් වීමේදී පැහැදිලිව පෙනීයන කාරණාවක් වන්නේ විද්වත් කමිටුව විසින් සකස් කරන ලද උපදේශන වාර්තාව 2011 අප්‍රේල් 23 වන දින මාධ්‍යයට නිකුත් කිරීමත් සමඟම පුවත්පත් මාධ්‍යය තුළ ප්‍රබල වෙනසක් සිදු වී ඇති බවයි. එහිදී මුද්‍රිත මාධ්‍යය හැසිරුණේ කෙසේද? ඒ සිදුවන බලපෑම කුමක්ද? ජාත්‍යන්තරයෙන් එල්ල වන බලපෑමත් සමඟ මාධ්‍ය ගොඩනගන ප්‍රතිරූපය කුමක්ද? ආදිය පිළිබඳව ගුණාත්මකව විශ්ලේෂණය කිරීමට පුළුවන.

සන්නිවේදනය යනු හුදෙක් යමක් සම්ප්‍රේෂණය කිරීමට ආධාරකයක්, සම්බන්ධයක් ලෙස ක්‍රියාකරන්නක් නොවේ. ජනමාධ්‍ය මඟින් ජනතාව වෙත ගලා එන පණිවිඩ නැත්නම් සංදේශ තුළින් ඔවුහු බලය (Power), පවත්වා ගෙන යන්නන් (Power Carriers), බලපෑම් (Influence) හඳුනා ගනිති. කිසියම් සමාජ රටාවක් තුළ ඇතිවන ගැටුම් ජනමාධ්‍ය මඟින් නිරූපනය වේ. මේනිසා ජනමාධ්‍ය සතු වූ කාර්යභාර්යයක් පවතී. එය කොටස් 05 කට වෙන්කර හඳුනාගත හැකිය.

1. ප්‍රවෘත්ති කරණය (News Making)
2. අර්ථ කථනය (Interpretation)
3. සමාජානුයෝජනය (Socialization)
4. ඒත්තු ගැන්වීම (Persuation)

.5 න්‍යාය පත්‍ර සැකැස්ම (Agenda setting)

යම් සමාජයක් තුළ ඇතිවන ගැටුම්, ජනමාධ්‍ය මඟින් පිළිබිඹු කරන්නේ ඉහත දැක්වූ කරුණු සහ සක්‍රිය ස්වභාවයකට පත් කරවමිනි. යම් ප්‍රවෘත්තියක්, ජනමාධ්‍යයකින් නිකුත් වෙත්ම මේ ක්‍රියාවලිය පණ ගැන්වේ. එහෙයින් සමාජීය ගැටුම් තුළින් ව්‍යුත්පන්න ව අරුත් ජනතාව තේරුම් ගන්නේ ජනමාධ්‍යය තුළින් ය.

මර්සුකි දරුස්මාන්, යස්මින් සූකා සහ ස්ටීවන් රැට්නර් යනු ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් විසින් පත් කරන ලද උපදේශක කමිටුවේ සාමාජිකයන් තිදෙනාය. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පාලනයට චෝදනාවක් එල්ල කරන කමිටුවක සාමාජිකයින් කවුරුන්ද යි විමසිලිමත් වීම ලාංකීය ජනමාධ්‍යයට පැවරෙන විශාල වගකීමකි. නමුත් උක්ත කාරණාව සම්බන්ධයෙන් දිවයින, දිනමිණ හා ලංකාදීප පුවත්පතෙන් ප්‍රශංසනීය කාර්යය භාර්යයක් ඉටු නොවූ බව පුවත්පත් පරිශීලනය කිරීමේදී පෙනී යයි. දිවයින හා දිනමිණ පුවත්පත විද්වත් කමිටුවේ

සාමාජිකයන් පිළිබඳව පුළුල් අවබෝධයක් පාඨකයාට ලබා දුන් බවක් පෙනෙන්නේ නැත. නමුත් ලංකාදීප පුවත්පත තීරු ලිපියක් මඟින් දරුස්මාන් කමිටුවේ සාමාජිකයින් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කොට ඇත. 2011 අප්‍රේල් 28 වන දින "ප්‍රදීපය" නම් තීරු ලිපිය තුළින් උදය ප්‍රභාත් ගම්මන්පිල මූන් කමිටු සාමාජිකයින් පිළිබඳ දළ විස්තරයක් ඉදිරිපත් කොට ඇත. නමුත් මෙම තීරු ලිපියේ අන්තර්ගතය පිළිබඳ විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ එහි සාමාජිකයින් ගේ ක්‍රියාකාරිත්වයේ එක් පැතිකඩක් පමණක් විග්‍රහකර ඇති බවයි. එම පුද්ගලයන් තිදෙනා ස්වාධීන පුද්ගලයන් නොවන බවට සාක්ෂි ඉදිරිපත් කරමින් එම තීරු ලිපිය සකසා ඇත. එම තීරු ලිපියේ එන වැදගත් කොටසක් මෙලෙස උපුටා දැක්විමට පුලුවන. "පණිවිඩය තරමටම පණිවිඩකරුවා ද වැදගත් ය." (The messenger is as important as the message) යනුවෙන් ඉංග්‍රීසි කියමනක් ඇත. එබැවින් මූන් වාර්තාව සැකසූ අය අපක්ෂපාත, අවංක සහ විශ්වසනීය අය නොවේ නම් එකී වාර්තාවේ අන්තර්ගතය හැදෑරීමට කාලය නාස්ති කළ යුතු නැත" (ලංකාදීප, 2011.04.28, 11 පිටුව).

නමුත් දිවයින හෝ දිනමිණ පුවත්පත මේ පිළිබඳ කිසිදු උත්සාහයක් රගෙන නොමැත. ඇතැම් අන්තර්ජාල පිටු හා විකල්ප පුවත්පත් මේ පිළිබඳව යම් බඳු උත්සාහයක් ගෙන ඇත. එහිදී සුනන්ද දේශප්‍රිය http://vikalpa.org නම් අන්තර්ජාල පිටුවට වාර්තාවක් ලබා දෙමින් විද්වත් මණ්ඩලයේ අඳුරු ඉතිහාසය නමින් විග්‍රහකොට ඇත. ඒ ඒ පුද්ගලයා විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගයන් වෙන වෙනම දක්වා පැහැදිලි අවබෝධයක් ලබාදීමට උත්සාහ ගෙන ඇත. එම ලිපිය කියවීමේදී පැහැදිලිව අවබෝධ වන කාරණාවක් වන්නේ මර්සුකි දරුස්මාන්, යස්මින් සූකා හා ස්ටීවන් රැට්නර් යන තිදෙනා ලෝකයේ සිදු වී ප්‍රබල අන්තවාදී ක්‍රියාකාරකම්වල මුලසුන හෙබ වූ තිදෙනෙකු බව ය. සමස්තයක් ලෙස ගෙන බලන විට විද්වත් මණ්ඩලයේ සාමාජිකයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ග්‍රාහක ප්‍රජාව වෙත ලබා දීමට දිවයින හා දිනමිණ යන පුවත්පත් දෙක කිසිදු උත්සාහයක් ගෙන නොමැත. ලංකාදීප පුවත්පත එහිදී ගත් උත්සාහය පැසසුමට ලක් කිරීමට පුලුවන.

විද්වත් මණ්ඩල වාර්තාව, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් වරයාට බාර දී ඇත්තේ 2011 අප්‍රේල් 13 වන දිනය. එම වාර්තාව නිල වශයෙන් මාධ්‍යයට ඉදිරිපත් කළේ 2011 අප්‍රේල් 23 වන දිනය. මෙම කාල සීමාව තුළ පුවත්පත් වාර්තා විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ උපදේශක කමිටු වාර්තාව මාධ්‍යයට ඉදිරිපත් කිරිමත් සමඟම දේශිය ජනමාධ්‍යය තුළ ප්‍රබෝධමත් බවක් ඇති විය. ඒ තුළින් දරුස්මාන් වාර්තාවේ අන්තර්ගතය විග්‍රහ කිරිමට ජනමාධ්‍යය පෙළඹුණේය. 2011.04.19 වන දින "මූන්ගේ කමිටුවේ විමර්ශන වාර්තාවෙන්" නම් වාර්තාවේ අන්තර්ගතය සාකච්ඡා කර ඇත. විද්වත් මණ්ඩල වාර්තාවේ අන්තර්ගත මූලික නිර්දේශයන් එම වාර්තාවේ පෙළ ගස්වා ඇත. නමුත් දරුස්මාන් වාර්තාව යනු පිටු 196 කින් සමන්විත වන විශාල ප්‍රමාණයේ වාර්තාවකි. එම වාර්තාවේ සංක්ෂිප්තය ඉදිරිපත් කිරීමට දිවයින පුවත්පත උත්සාහ ගෙන නොමැත. ලංකාදීප පුවත්පත එහිදී ප්‍රශස්ත කාර්යයක් ඉටු කර ඇති බව පෙනී යයි.

විද්වත් කමිටු වාර්තාව මාධ්‍යයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කිරීමට දේශීය පුවත්පත ප්‍රබල උත්සාහයක් ගෙන නොමැත. මීට අදාලව තොරතුරු ග්‍රාහක ගත කිරීමේදී සෑම පුවත්පත් මාධ්‍යවේදියෙක්ම විද්වත් කමිටු වාර්තාව කියවා ඇත්තේ අන්තර්ජාලය ඇසුරෙන් ය. ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ උපදේශන කමිටුවේ සංක්ෂිප්ත වාර්තාව www.lankatruth.com තුළින් ද දළ පරිවර්තනයක් ඉදිරිපත් කොට ඇත. යුද අපරාධ චෝදනාව එල්ල වන්නේ ශ්‍රී ලංකාවට විරුද්ධව ය. එහිදී ජනතාව දැනුවත් කිරීමේ ප්‍රබල වගකීමක් ආණ්ඩුවට හා ජනමාධ්‍යයට පවතී. නමුත් කිසිම අවස්ථාවක එම වගකීම ඉටු කිරීමට ආණ්ඩුව හෝ මාධ්‍ය උත්සාහ ගෙන නැත. නමුත් එක්සත් ජාතික පක්ෂය මේ වන විට දරුස්මාන් වාර්තාවේ සමස්තය සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කර ඇත. http://vikalpa.org වෙබ් පිටුව මඟින්ද දරුස්මාන් වාර්තාවේ සාරාංශයේ සිංහල පිටපතක් ඉදිරිපත් කොට ඇත. නමුත් මෙම සාරාංශය ඉදිරිපත් කිරීමේදී ඔවුන් ශීර්ෂය ලෙස ඉදිරිපත් කර ඇත්තේ "සිය මිලිටරි මෙහෙයුම ව්‍යාප්ත කළේ සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවකට මරු කැඳවමින්ය" (http://vikalpa.org/?p=6406). යනුවෙන් ය. විද්වත් කමිටු වාර්තාව මාධ්‍යට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කිරීමට දිනමිණ පුවත්පත ද උත්සාහ ගෙන නොමැත. නමුත් ඇතැම් අවස්ථාවල විවිධ විශේෂාංග ඇසුරින් දරුස්මාන් වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව සාකච්ඡා කර ඇත. ශ්‍රී ලංකාවේ යුද අපරාධ චෝදනාව

සම්බන්ධයෙන් දිවයින පුවත්පතේ වැඩි වාර්තා ප්‍රමාණයක් ලියා ඇත්තේ කීර්ති වර්ණකුලසූරිය ය. ඔහු පෞද්ගලිකව දරුස්මාන් වාර්තාව ඒක පාර්ශවීය වාර්තාවක් බව ප්‍රකාශ කරයි. එමෙන්ම එම මතවාදය දිවයින පුවත්පත මඟින් ද අනාවරණය කර ඇත. 2011.04.18 වන දින දිවයින පුවත්පත වාර්තාවෙන් ඉදිරිපත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත්තේ, "මූන්ගේ කමිටු වාර්තාව ඒකපාර්ශවීකයි" (http://www.divaina.com/2011/04/18/news06.html) යනුවෙනි ය.

එමෙන්ම දිවයින පුවත්පත 2011.04.20 දින විශේෂාංගයක් මඟින් කමිටු වාර්තාව පෞද්ගලික ත්‍රස්තවාදී මෙහෙයුමක් බව වාර්තා කරයි. විශේෂයෙන්ම එම වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියට, සාමාන්‍ය සම්ප්‍රදායට හා සදාචාරයන්ට එරෙහි පෞද්ගලික ත්‍රස්තවාදී මෙහෙයුම් වාර්තාවක් ලෙස දක්වයි. එම විශේෂාංගයේ ශීර්ෂය ඉදිරිපත් කර ඇත්තේ,"එක්සත් ජාතීන්ගේ කමිටු වාර්තාව පෞද්ගලික ත්‍රස්තවාදී මෙහෙයුම් වාර්තාවක්" (http://www.divaina.com/2011/04/20/news16.html) ලෙස දක්වා ඇත. දරුස්මාන් වාර්තාව කිසිඳු පදනමක් නැති වාර්තාවක් ලෙස ලංකාදීප කර්තෘ ආරියනන්ද දොඹගහවත්ත පවසයි. (ආරියනන්ද දොඹගහවත්ත, 2011.08.31, පෞද්ගලික සන්නිවේදනය).

සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානව හිතවාදී නීතියේ (Cutomary International Humantarian Law) (VIII) (ආ) 1 කොටසින් "ප්‍රහාරයක් කරන විට හෝ ප්‍රහාරයකට සූදානම් වන විට සටන්කාමීන්/යුද්ධය කරන්නන් විසින් තමන් සිවිල් ජනතාවගෙන් වෙන්කර හඳුනාගත යුතුය." යැයි සඳහන් කර ඇත. දොඹගහවත්ත පවසන ආකාරයට එම පිරිස සිවිල් ඇඳුමෙන් සිටි පුහුණුවක් ලද අය ලෙස සැලකිය හැක. දිනමිණ පුවත්පත ද දරුස්මාන් වාර්තාව ඒකපාර්ශවීය වාර්තාවක් බව සටහන් කර ඇත. 2011 මැයි 05 වන දින දිනමිණ පුවත්පතේ "පසු විපරම" නම් තීරු ලිපිය මඟින් ඒ බව අවධාරණය කර ඇත. එහිදී විශේෂයෙන්ම සඳහන් කර ඇත්තේ වාර්තාව මඟින් L.T.T.E ය විනය ගරුක හමුදාවක් බව ඒත්තු ගන්වා තිබීමේ වැකිය විවේචනය කිරීමයි."L.T.T.E ය විනය ගරුක හමුදාවක් නම් හිට්ලර්ගේ S.S හමුදාව ලොව විනයගරුකම හමුදාව බවට පිළිගත යුතුය" (දිනමිණ, 2011.05.05, 07 පිටුව). "දරුස්මාන් ලා සිය වාර්තාවට ඇතුළත් කර ඇත්තේ L.T.T.E යට පක්ෂ ඡායාරූප පමණක් බව පෙනී යයි. මානුෂික මෙහෙයුමේ අවසාන දින කිහිපය තුළ අපේ රණවිරුවන් දෙමළ සිවිල් ජනතාව මුදාගත් ආකාරය දක්වෙන කිසිඳු ඡායාරූපයක එහි ඇතුළත් කර නැත. ප්‍රභාකරන්ගෙන් ගැලවී හමුදාවට භාර වූ වයසක අම්මලා, තාත්තලා ඔසවාගෙන ආ හැටිත් ගර්භනී මවුවරුන්ට ඇප උපස්ථාන කළ හැටිත් අපේ හමුදාවන් කුඩා දරුවන් වඩාගෙන හුරතල් කළ හැටිත් දරුස්මාන් නොදන්නවා නොවේ" (දිනමිණ, 2011.05.05, 07 පිටුව)

එමෙන්ම 2011 මැයි 02 දින "මූන්-දරුස්මාන් නොදකින මානුෂීය මෙහෙයුම" නම් ශීර්ෂයෙන් දිනමිණ පුවත්පත "සතියේ ගවේෂණය" නම් විශේෂාංගයෙන් දරුස්මාන් වාර්තාවේ ඒක පාර්ශවීය භාවය පෙන්නුම් කර ඇත. "දරුස්මාන්ලා පිටු 196 ක් පිරෙන්නට ලියා ඇති මේ වාර්තාවේ මානුෂීය මෙහෙයුමේ අවසන් අදියරේදි L.T.T.E ග්‍රහණයෙන් මිදී පලා එන අහිංසකයන්ට දෙමළ ජනයාට ත්‍රස්තවාදීන් වෙඩි තබන විට ඉදිරියට යමින් ඔවුන්ගේ රැකවරණය සැලසූ යුද හමුදාව ගැන සඳහන් කර නැත. වයෝවෘද්ධ තැනැත්තන් කරමතින් ගෙන ආ හමුදා සෙබලු ගැන වචනයක් නැත. දින ගණන් නිරාහාරව සිටිමින් තමන් වෙත ආ අහිංසක දෙමළ මිනිසුන්ට තමන්ගේ බත් පතත්, දුන් සහ උණු බත් උයා දුන් හමුදා සොල්දාදුවන් ගැන කිසි සඳහනක් නැත" (දිනමිණ, 2011.05.02,18 පිටුව).

එහිදී "විනය ගරුක අපේ හමුදාව කළ දේ" යනුවෙන් ඡායාරූපයක් හා "විනය ගරුක යැයි කියන L.T.T.E හමුදාව කළ දේ" යනුවෙන් ඡායාරූපයක් මෙම විශේෂාංගයට එකතු කරමින් දරුස්මාන් වාර්තාවේ ඒක පාර්ශවීය භාවය ඔප්පු කර ඇත. මේ පිළිබඳව දිනමිණ කර්තෘ මහින්ද අබේසුන්දර සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේදී විද්වත් කමිටු වාර්තාව ඊනියා වාර්තාවක් ලෙස පෙන්වා දේ. එම ඊනියා වාර්තාව නීත්‍යානුකූල නොවන බව හා සදාචාරාත්මක නොවන බව දක්වයි. වාර්තාව ඒක පාර්ශවීය බවත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පොදු සම්මුතීන් උල්ලංඝනය කර ඇති බවත් එම සම්මුඛ සාකච්ඡාවෙන් පැහැදිලි විය. විද්වත් කමිටු වාර්තාව නීත්‍යානුකූල නොවන, සදාචාරාත්මක නොවන ලියවිල්ලක් පමණක් නොව වාර්තාවක් බව මහින්ද අබේසුන්දර පවසයි.

ලංකාදීප පුවත්පත ද 2011 මැයි 01 දින "30 අවුරුදු යුද්ධයේ අමානුෂික සංහාර" නමින් විශේෂාංගයක් ඉදිරිපත් කරමින් දරුස්මාන් වාර්තාවේ ඒකපාර්ශවීය භාවය ඔප්පු කරනු ලැබේ. බෑන් කී මූන් ට නොපෙනුණු අනුරාධපුර ඝාතනය පිළිබඳ සටහනක් කර ඇත. (ලංකාදීප. 2011.05.01.16 පිටුව).අනුරාධපුර උඩ මලුවට L.T.T.E ය විසින් පහර දුන් අවස්ථාවේ ගත් ඡායාරූප 05 ක් සහිතව මෙම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් දරුස්මාන් වාර්තාව L.T.T.E සංවිධානයට හිතවාදීව සකස් කළ වාර්තාවක් බව සනාථ කර ඇත. දරුස්මාන් වාර්තාව පිළිබඳව රාවය පුවත්පතේ ප්‍රධාන කර්තෘ වික්ටර් අයිවන් කියා සිටියේ, "මෙම විද්වත් මණ්ඩල වාර්තාව ඒක පාර්ශවික වාර්තාවක්. බවයි" (වික්ටර් අයිවන්, 2011.08.30, පෞද්ගලික සන්නිවේදනය).

විද්වත් මණ්ඩලයේ වාර්තාවේ පවතින නෛතික භාවය පිළිබඳ තොරතුරු විමසා බැලීමේදී දිවයින, දිනමිණ හා ලංකාදීප යන පුවත්පත් තුනම ප්‍රබල උත්සාහයක් ගත් බව පෙනී යයි. දිවයින පුවත්පත 2011 ජනවාරි 01 දින සිට 2011 ජූනි 30 දක්වා දරුස්මාන් වාර්තාවේ පවතින්නා වූ නෛතිකභාවය පිළිබඳව වාර්තාවන් 11 ක් ප්‍රකාශයට පත් කොට ඇත. එයින් 01 ක් කර්තෘ වාක්‍යයක් යටතේ ද, 07 ක් ප්‍රවෘත්ති ලෙස ද ඉතිරි 03 විශේෂාංග ලෙස ද ඉදිරිපත් කර ඇත. දරුස්මාන් වාර්තාවේ පවතින්නා වූ නෛතිකභාවය මාධ්‍යයක් ලෙස දිවයින පුවත්පත විමර්ශනය කිරීමේදී මූලික වශයෙන් පැතිකඩවල් කිහිපයක් ඔස්සේ කරුණු ගොනු කර ඇත. එම පැතිකඩවල් පහත පරිදි පෙළගැස්විය හැක.

1. වාර්තාවට පවතින්නා වූ නීත්‍යානුකූල භාවය,
2. කමිටුවට පවතින්නා වූ නීත්‍යානුකූල භාවය,
3. එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තිය එකඟ වන ආකාරය,
4. මහලේකම්ට පවතින බලය,

ආදිය කෙරෙහි අවධානය යොමු කර ඇත. 2011 අප්‍රේල් 25 වන දින "නීතියට උඩින් පැන යාමට ඉඩ නොදෙමු" යන ශීර්ෂයෙන් ලියන ලද කර්තෘ වාක්‍ය තුළින් දරුස්මාන් වාර්තාව නීතිමය නොවන වාර්තාවක් බව ප්‍රකාශ කොට ඇත. විශේෂයෙන්ම ද්වේශ සහගත භාෂා රටාවක් උපයෝගී කරගනිමින් රචිත මෙම කර්තෘ වාක්‍යය, වාර්තාවේ පවතින නීත්‍යානුකූලභාවයට වඩා කමිටුවේ පවතින නීති විරෝධී අවස්ථා උලුප්පා ගැන්වීමට උත්සාහ ගෙන ඇති බවක් පෙනේ. දිවයින පුවත්පත පළකරන ලද ප්‍රවෘත්ති තුළින් මෙම කාරණාව වඩා ඉස්මතු කිරීමට උත්සාහයක් දරා ඇත. 2011 අප්‍රේල් 20 වන දින අකිත පෙරේරා, ගුණදාස අමරසේකරගේ ප්‍රකාශයක් පදනම් කරගෙන කමිටු වාර්තාවට කිසිදු නීත්‍යානුකූල පදනමක් නැති බවට වාර්තා කොට ඇත. (http://www.divaina.com/2011/04/20/news04.html).

මෙහිදී එහි නීත්‍යානුකූල පදනම පිළිබඳ කිසිදු විග්‍රහයක් කර නැත. එනම් නීත්‍යානුකූල නොවන්නේ කුමන කාරණා පදනම් කරගෙනද? ජාත්‍යන්තර නීතියත් සමඟ එම යුද අපරාධ චෝදනා ගලපන්නේ කෙසේද? ආදී කාරණා කිසිවක් කෙරෙහි අවධානය යොමු කොට නැත. 2011 අප්‍රේල් 21 දින අධිනීතිඥ ගොමින් දයාසිරි, මූන්ගේ ඒක පාර්ශවීය කමිටුවෙන් දඬුවම් ලබාදීමට නොහැකි බව ප්‍රකාශ කරයි. ඒ පිළිබඳ පුළුල් විස්තරයක් දිනමිණ පුවත්පත 2011.04.25 දින වාර්තා කරයි. එහි ශීර්ෂය වන්නේ "මූන්ගේ කමිටු වාර්තාව ඒක ලියූ කඩදාසිය තරම්වත් වටින්නේ නෑ."(දිනමිණ, 2011.04.25, 06 පිටුව)යන්නයි. එසේම ආරක්ෂක අංශ සමඟ සාකච්ඡා කිරීමක් සිදු නොකර බෑන් කී මූන් වාර්තාව සකසා ඇති හෙයින් එමගින් අප රටට හානියක් සිදු කළ නොහැකි බවට ප්‍රකාශ කොට ඇත. ඒ කෙසේ වෙතත් අප රටට විරුද්ධව මානුෂීය අයිතිවාසිකම් කවුන්සිලයට යෝජනාවක් ගෙන ගිය හොත් මෙරට රජය යුද අපරාධ කළේ යැයි පවසා ජාත්‍යන්තර යුද්ධාධිකරණය හමුවට ගෙන යෑමේ හැකියාවක් පවතින බව එම ප්‍රවෘත්ති වාර්තාවේ හා දිනමිණ සම්මුඛ සාකච්ඡාවේ සටහන් වේ. දරුස්මාන් වාර්තාවේ නීත්‍යානුකූල භාවය පිළිබඳ තක්සේරු කිරීමේදී දිවයින පුවත්පත මූලික ලෙස උත්සාහගෙන ඇත්තේ එහි නීත්‍යානුකූල නොවන වාර්තාවක් බවට සනාථ කිරීමටය. එක්සත් ජාතින්ගේ සංවිධානයට අනුකූල නොවන අයුරින් පත් කෙරුණු බෑන් කී මූන් ගේ විද්වත් කමිටු වාර්තාව මුද්‍රණය කිරීම, එළි දැක්වීම මෙන්ම එහි ඇති නිර්දේශ මත කටයුතු කිරීම මුළුමනින්ම වැරදි සහගත ක්‍රියාවක් බව සඳහන් කරයි. මේ පිළිබඳව 2011 අප්‍රේල් 22 වන දින ද දිවයින පුවත්පත විදේශ ඇමති ජී.ඇල් පීරිස්ගේ ප්‍රකාශයක් පදනම් කරගෙන සහන් ගමගේ විසින් වාර්තා කොට

ඇත. "නීත්‍යානුකූල වී කිසිදු ආයතනික පැවැත්මක් නොමැති එම කමිටුව මෙලෙස ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනයක් කිරීම මඟින් සිදුකර ඇත්තේ ඔවුන්ට හිමිව තිබූ බලතල ඉක්මවා යාමකි" (http://www.divaina.com/2011/04/22/news26.html).

අනෙකුත් අතට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කිරීමට දරුස්මාන් කමිටුව උත්සාහ ගෙන ඇති බවට මතයක් ස්ථාපිත කිරීමට දිවයින පුවත්පත උත්සාහ කර ඇත. නමුත් මහලේකම්වරයාට උපදෙස් ගැනීමට කමිටුවක් පත්කළ හැකි බවත්, එම කමිටුවට වාර්තාවක් සකස් කොට මහ ලේකම්වරයාට ලබාදීමට නීතිමය බලයක් ඇතිබව ප්‍රකාශ කිරීමට කිසිම අවස්ථාවක දිවයින පුවත්පත උත්සාහ ගෙන නොමැත. මේ පිළිබඳව නීතිඥ ප්‍රතිභා මහානාමගෙන් කළ විමසීමේදී ඔහු ප්‍රකාශ කර සිටියේ මහලේකම්වරයාට උපදෙස් ගැනීමට එම කමිටුව භාවිතා කළත් එතැනින් එහාට එය රැගෙන යාමේ බලයක් නොමැති බවයි. ඒ පිළිබඳව නීතිඥ ජගත් ලියනආරච්චි ප්‍රකාශ කරන්නේ ද ඊට සමාන මතයකි. "එය නෛතික වාර්තාවක් නොවෙයි. මහලේකම්වරයාට උපදෙස් ගැනීමට පත් කළ කමිටුවක්. ඒ වාර්තාවෙන් උපදෙස් ගැනීම හැර එතැනින් එහාට ගමන් කළ නොහැකිය" (නීතිඥ ජගත් ලියනආරච්චි, 2011.09.05, පෞද්ගලික සන්නිවේදනය).

විද්වත් කමිටු වාර්තාවේ නීත්‍යානුකූල භාවය පිළිබඳ විමර්ශනය කිරීමට දිවයින පුවත්පත ගත් උත්සාහයට වඩා අඩු උත්සාහයක් දිනමිණ පුවත්පත දරා ඇති බව බැලූ බැල්මට පෙනී යයි. අදාල කාල සීමාව තුළ කමිටු වාර්තාවේ නීත්‍යානුකූල භාවය පිළිබඳ විමර්ශනය කිරීමට දිනමිණ පුවත්පත වාර්තා කොට ඇත්තේ ප්‍රවෘත්ති 01 ක් හා විශේෂාංග 02 ක් පමණි. එම විශේෂාංග දෙකම පදනම් වී ඇත්තේ විදේශ ඇමති ජී.ඇල්. පීරිස් ගේ අධි නීතිඥ ගෝමින් දයා ශ්‍රී ගේ ප්‍රකාශ පදනම් කරගෙන ය. 2011 මැයි 07 වන දින දරුස්මාන් වාර්තාවේ කිසිදු නීතිමය පදනමක් නැති බව ප්‍රකාශ කරමින් දිනමිණ පුවත්පත ප්‍රවෘත්ති වාර්තාවක් ඉදිරිපත් කොට ඇත. මේ අනුව විද්වත් කමිටු වාර්තාවේ නීත්‍යානුකූල පදනම විමර්ශනය කිරීමේදී දිනමිණ පුවත්පත ඒ පිළිබඳ ප්‍රබල මතවාදයක් පාඨකයා තුළට ගෙන යාමට උත්සාහ ගෙන නොමැති බව පෙන්වා දිය හැක. නමුත් හැකි සෑම අවස්ථාවකදීම ආණ්ඩුව විද්වත් කමිටු වාර්තාවට විරුද්ධ බව ප්‍රකාශ කිරීමට උත්සාහ ගෙන ඇත.

මෙම කාරණාව පිළිබඳව ලංකාදීප පුවත්පත විද්වත් කමිටු වාර්තාවේ නීත්‍යානුකූලභාවය පිළිබඳව තර්කාන්විත මතයක් ගොඩනැගීමට උත්සාහ ගෙන නොමැත. ප්‍රකාශිත වාර්තා පිළිබඳ සලකා බලන විට ලංකාදීප පුවත්පත අදාල කාල සීමාව තුළ ප්‍රවෘත්ති 03 ක් හා විශේෂාංග 03 ක් ඉදිරිපත් කොට ඇත. ඒවායේ දරුස්මාන් වාර්තාවට ශ්‍රී ලංකාවේ සිදු වූයේ යැයි කියන බරපතල මානව හිමිකම් කඩවීම පිළිබඳව ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට බලයක් නොමැති බව වාර්තා කරයි. එමෙන්ම ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ මහලේකම් වරයාට යවන ලද සංදේශයේ සිංහල පිටපතක් 2011 අප්‍රේල් 26 වන දින වාර්තා කොට ඇත. මේ සියල්ල තුළ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ දිවයින පුවත්පත විද්වත් කමිටු වාර්තාවේ පවතින නීත්‍යානුකූල නොවන අවස්ථා හෙළිදරව් කිරීම පදනම් කරගෙන එයට විරුද්ධව දේශීය මහජන මතය මෙහෙය වීමට උත්සාහ ගනිද්දී දිනමිණ හා ලංකාදීප පුවත්පත් වලට වඩා ප්‍රබල උසිගැන්වීමක් දිවයින පුවත්පත මඟින් සිදුකර ඇති බවයි.

දිවයින, දිනමිණ හා ලංකාදීප යන පුවත්පත් තුන මෙම වාර්තාකරණයේ යෙදීමේදී එක් පුවත්පතක් අනෙක් පුවත්පත පරයා නැගී සිටීමට ගත් ක්‍රියාමාර්ග මොනවාදැයි මෙහිදී අධ්‍යයනය කිරීමට පුලුවන. එහිදී දිවයින පුවත්පත සාම්ප්‍රදායික ක්‍රමවේදයන් අනුගමනය කළ බව පෙනී යයි. එනම් හුදෙක් දරුස්මාන් වාර්තාවේ නීත්‍යානුකූලභාවය, එහි වැරදි සහගත තැන් දේශපාලඥයින්ගේ මත ආදී වශයෙන් සාම්ප්‍රදායික ක්‍රමයට කොටු වූ ආකාරයක් දැකිය හැකිය. මෙම කාරණාව පිළිබඳව ලංකාදීප පුවත්පතේ ද විශේෂත්වයක් දැකිය නොහැක. නමුත් දිනමිණ පුවත්පත මෙම කාරණාව සම්බන්ධයෙන් පෙරමුණේ සිටි ආකාරයක් දැකිය හැකිය. විශේෂයෙන් කර්තෘ වාක්‍ය, විචිත්‍රාංග ලිපි, සම්මුඛ සාකච්ඡා ආදියට අමතරව විවිධ පුද්ගලයන්ගේ මතවාද ඇසුරෙන් ප්‍රබල ජනමතයක් ගොඩනැගීමට උත්සාහ ගන්නා ලදී. විශේෂයෙන්ම "දරුස්මාන්ගේ මතභේදාත්මක වාර්තාව පිළිබඳව කලාකරුගේ ඇසින්" යනුවෙන් තීරු ලිපියක් තුළින් ප්‍රබල මතවාදයක් ඇති කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම දරුස්මාන් වාර්තාව පිළිබඳව සිවිල් පුරවැසියන්ගේ මතය කුමක්දැයි 2011.04.25 වන දින තීරු ලිපියක් මඟින් වාර්තා කොට ඇත. ඊට අමතරව පූජනීය පක්ෂයේ මතවාදය ද පුවත්පත තුළින් ඉදිරිපත් කිරීම හරහා දරුස්මාන් වාර්තාව තමුවේ ඇති බලපෑම ජනතාවට කා වැද්දීමට

දිනමිණ පුවත්පත උත්සාහ ගෙන ඇති බව පෙනේ. මෙවැනි කාරණා තුළින් ග්‍රාහක අවධානය තව තවත් වැඩි කර ගැනීමට දිනමිණ පුවත්පත කටයුතු කර ඇත.

අනෙක් අතට පාඨකයාගේ අවධානය යොමු කර ගැනීමට පුවෘත්තියක් සකස් කිරීම සඳහා මාධ්‍යවේදියා දක්ෂ විය යුතුය. එය බැලූ බැල්මට ප්‍රවෘත්ති ශීර්ෂය තුළින් හඳුනා ගැනීමට හැකිවිය යුතුය. දිවයින, දිනමිණ හා ලංකාදීප යන පුවත්පත් තුනම ප්‍රවෘත්ති ශීර්ෂය සකස් කිරීමේදී සරල රීතියක් අනුගමනය කළ බව පෙනේ. බොහෝ විට යම් පුද්ගලයෙක් කළ ප්‍රකාශයක් එම ප්‍රවෘත්තියේ ශීර්ෂය බවට පත් කරගෙන ඇත.

මේ අනුව පෙනී යන කාරණාවක් වන්නේ ජාත්‍යන්තරයෙන් එල්ලවන අභියෝග හමුවේ රටක් වශයෙන් කටයුතු කිරීමට ස්වාධීන වූ ජාතික ප්‍රතිපත්තියක් දේශීය මාධ්‍යයට නොමැති බවයි. ඔවුන් ඔවුන්ට ආවේණික වූ න්‍යාය පත්‍රයක් මත යැපෙමින් කටයුතු කරන බව පැහැදිලිව පෙනෙන කාරණාවක් වේ.

ශ්‍රී ලංකාව වූ කලී දූපතක් නමුත් ලෝකයෙන් වෙන් වී කටයුතු කළ නොහැකිය. සමස්ත ලෝකයක් සමඟ ගනුදෙනු කිරීමේදී අනෙකුත් රටවල හැඟීම්, දේශපාලන මතවාද, සමඟ ගනුදෙනු කිරීමට සිදු වේ. ශ්‍රී ලංකාවට විරුද්ධව යුද අපරාධ සිදු වූ බවට චෝදනා එල්ල වූ විටෙක දේශීය මාධ්‍ය ක්‍රියාකාරිත්වය තුළ පවතින තත්වය යම්කිසි සීමාවක් දැකිය හැකිය. එයට ප්‍රධාන හේතුවක් වන්නේ පවතින තත්වය නිවැරදිව ඉදිරිපත් කිරීමට කවුරුන් හෝ ඉදිරිපත් නොවීමයි. නමුත් රජයේ මාධ්‍ය ප්‍රකාශක යම් කිසි මතවාදයක් ප්‍රකාශ කිරීම සිදු කරයි. මේ නිසා දේශීය වශයෙන් ගත් විට යුද අපරාධ චෝදනාව පිළිබඳව පුළුල් කතිකාවතක් ගොඩනැගෙන්නේ නැත. නමුත් ලෝකයේ පවතින සමස්ත මාධ්‍යය ජාලය යම් න්‍යාය පත්‍රයකට අනුකූලව කටයුතු කරයි. එනම් ලංකාව මානව හිමිකම් සැසිවාරයට තල්ලු කිරීමටයි. මේ නිසාම දේශීය මාධ්‍ය ලංකාවේ යුද අපරාධ සිදු වූ බව තරයේ ප්‍රතික්ෂේප කරනු ලැබේ. නමුත් ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු කරන විට විදේශීය ජනමාධ්‍ය අපට අමතක කළ නොහැක. එහිදී Chanel 4 නාලිකාව ශ්‍රී ලංකාව යුද අපරාධ සිදු කළා යැයි ප්‍රකාශ කරන මතය ප්‍රත්‍යක්ෂ කිරීමට ප්‍රබල උත්සාහයක් ගත් බව පෙනී ගියේ ය. Chanel 4 නාලිකාව Sri Lankan Killing Fields නම් වාර්තා චිත්‍රපටය තිරගත කිරීමත් සමඟම දෙස් විදෙස් ජනතාවගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු විය. එය තිරගත වූයේ 2011 ජූනි 03 වන දිනය. ඒ අනුව Chanel 4 නාලිකාව Sri Lankan Killing Fields වාර්තා චිත්‍රපටය තිරගත කිරීමත් සමඟම එහි පවතින යථාර්තය ගවේෂණය කිරීමේදී දිනමිණ හා ලංකාදීප පුවත්පත් දෙකට වඩා විශාල කාර්යභාරයක් දිවයින පුවත්පතෙන් සිදු වූ බව දැකිය හැකිය. ඒ අනුව දිවයින පුවත්පත 2011 ජූනි මස 05 වන දින "කොටි සහ චැනල් 4 එක් වී ජිනීවාහිදී දියත් කළ කුමන්ත්‍රණය" නම් විශේෂාංගය තුළින් වාර්තා චිත්‍රපටයේ සුල මුල සෙවීමට උත්සාහ කර ඇත. එහිදී ප්‍රභාකරන්ගේ ඝාතන සම්බන්ධව කිසිදු වාර්තාමය චිත්‍රපටයක් නිෂ්පාදනය නොකළ චැනල් ෆෝ කණ්ඩායම මෙම වාර්තා චිත්‍රපටය තුළින් ශ්‍රී ලංකාවේ හමුදාව දැඩි අවමානයට ලක් කර ඇති බව ප්‍රකාශ කරයි.

ඊට අමතරව විද්වත් යැයි හඳුන්වන මණ්ඩලය ත්‍රස්තවාදයට සහය දක්වන ආකාරය විග්‍රහ කර ඇත. 2011 ජූනි මස 12 වන දින "කොටි යුද අපරාධකරුවන්ට ජිනීවා එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දොර විවෘත වේ." යනුවෙන් විශේෂාංගයක් තුළින් ශ්‍රී ලංකාවට යුද අපරාධ චෝදනා එල්ල කිරීම පිටුපස සිටින පුද්ගලයන් හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. එහිදී ප්‍රධාන වශයෙන් සුරෙන් සුරේන්ද්‍රන්, වී. කිරුබාකරන් හා ගැරි ආනන්ද සංගරී යන තිදෙනාගේ මැදිහත්වීම ප්‍රධාන වේ. මීට අමතරව දිවයින පුවත්පත 2011 ජූනි 16 දින 'චැනල් ෆෝ කොටි කොන්ත්‍රාත්තුව' නම් විශේෂාංගය තුළින් Sri Lankan Killing Fields වාර්තා චිත්‍රපටයේ පසුබිම අනාවරණය කර ඇත. එහිදී තිරපිටපත, අධ්‍යක්ෂණය, අනුග්‍රහය, බෙදාහැරීම ආදී සමස්තය ඉදිරිපත් කොට ඇත. එමෙන්ම "චැනල් ෆෝ බොරු යි කීම ප්‍රමාණවත් ද?" යන විශේෂාංගය තුළින් වීඩියෝ පටියට අප එරෙහි විය යුත්තේ කෙසේද? යන්න කෙරෙහි අවධානය යොමු කර ඇත. මේ සමස්තය තුළ දිවයින පුවත්පත ප්‍රකාශ කිරීමට උත්සාහ ගත්තේ මෙම සියලු ජාත්‍යන්තර බලවේග තුළ සැඟවුණු ගිණි අඟුරු මෙන් L.T.T.E අවතාර තවමත් සැරිසරණ බවයි. අනෙක් අතට මෙවැනි චෝදනාවක් ජාත්‍යන්තරයෙන් එල්ලවන විට මාධ්‍ය කටයුතු කළ ආකාරය විදේශීය නිදසුන් ඔස්සේ විග්‍රහ කිරීමට ද දිවයින පුවත්පත කටයුතු කර ඇත. 2011 ජූනි මස 18 වන දින ''පුවතක පසුබිම'' නම් විශේෂාංගය තුළින් "යුද අපරාධකරුවන් ශ්‍රී ලංකාවට එහෙිව හඬ නැගීම" නම් තේමාව ගත් විශේෂාංගය නිදසුන්

කොට ගත හැකිය. විශේෂයෙන්ම ඇමරිකානු හමුදාවට මේ ආකාර චිත්‍රපට නිර්මාණය වෙද්දී ඇමරිකානු ප්‍රචාරක යාන්ත්‍රණය ව්‍යාජ චිත්‍රපට මඟින් හමුදාවේ නාමය රැකගත් ආකාරය අනාවරණය කර ඇත. එහිදී විශේෂයෙන්ම ඇමරිකාව, බ්‍රිතාන්‍ය වැනි රටවල් විසින් කරන ලද යුද අපරාධ වලට අදාල සාධාරණ සහ විශ්ලේෂණාත්මකව විග්‍රහ කර ඇත. මේ සන්දර්භය තුළ Chanel 4 මෙහෙයවීම තුළ ඇති යථාර්ථය අනාවරණය කිරීමට දිවයින පුවත්පත පුළුල් ගවේෂණාත්මක වාර්තාකරණයක යෙදුණු බව ප්‍රකාශ කළ හැක.

Chanel 4 වාර්තා චිත්‍රපටයට අදාලව දිනමිණ පුවත්පත වාර්තා කිරීමේදී මූලික වශයෙන් ඔවුන් උත්සාහ ගෙන ඇත්තේ එම චිත්‍රපටය තුළින් මෙරටට හා ආණ්ඩුවට එල්ලවන අපකීර්තිය ඉවත් කර ගැනීමටය. ඒ සඳහා මුලින්ම දිනමිණ පුවත්පත 2011.06.02 දින චැනල් 4 වීඩියෝව ගැන සෘණික නිගමන එපා" යන තේමාවෙන් රචිත වාර්තාව තුළින් යුද්ධය පැවති සමයේ සිදු වූ ක්‍රියාවන් සම්බන්ධයෙන් රාජ්‍යය නොවන සංවිධාන, මානව හිමිකම් සංවිධාන හා මාධ්‍ය ආයතන මඟින් යුද මෙහෙයුම්වල නෛතික භාවය නොතකා අපරීක්ෂාකාරී ලෙස ඇතැම් දේ ප්‍රසිද්ධියට පත් කර ඇති බවයි. නමුත් 2011 මැයි 14 දින දිනමිණ පුවත්පත දිවයින හා ලංකාදීප යන පුවත්පත් දෙක අනුගමනය නොකල විශේෂ ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. එනම් ඩිජිටල් තාක්ෂණ විශේෂඥයෙකුගේ ප්‍රකාශයක් පදනම් කරගෙන චැනල් ෆෝ වීඩියෝ පටයේ අසත්‍යතාවය ප්‍රකාශ කිරීමයි. ඒ තුළින් චැනල් ෆෝ වීඩියෝ පටයට විරුද්ධව ජනතාව පෙළ ගැස්වීම සිදු කර ඇත. මීට අමතරව චැනල් ෆෝ නාලිකාව 1983 ගෙනගිය ප්‍රයත්නයක සුල මූල ඉදිරිපත් කිරීමටද දිනමිණ සමත් වී ඇත. 2011 මැයි 20 වන දින "චැනල් හතරේ රෙදි ගැලවෙයි." යන තේමාවෙන් සකස් වූ විශේෂාංගයේ සඳහන් වන්නේ චැනල් 4 නාලිකාව ළමයින් යොදා ගනිමින් නිර්මාණය කළ පොප් ගීත ගායන තරඟාවලියක දී කුඩා දරුවන් වැඩිහිටියන් සේ සරසා ලිංගික හැඟීම් උද්දීපනය වන අයුරින් වැඩසටහනක් ඉදිරිපත් කර ඇති බවයි. එමෙන්ම 1986 වසරේ ලිංගික දර්ශන ඇතුළත් චිත්‍රපට පෙළක් විකාශය කිරීමෙන් මහත් ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති විය. එහිදී එල්ල වූ චෝදනා හමුවේ චිත්‍රපට ප්‍රදර්ශනය නවතා දමූ අතර 2011 වසරේදී සමලිංගිකත්වයට ඉස්මතු වන අදහස් සහිතව කළ වැඩසටහනට එල්ල වූ මහජන විරෝධය හමුවේ ප්‍රසිද්ධියේ සමාව අයැදීමට බ්‍රිතාන්‍ය රූපවාහිනී කොමිෂම මඟින් Chanel 4 ආයතනයට නියම කර ඇති බවයි. මෙලෙස සාක්ෂි එකින් එක පෙළ ගස්වමින් මාධ්‍ය ආයතනයක් වශයෙන් Chanel 4 වෙත පවතින විශ්වසනීයත්වය පිළිබඳව දිවයින පුවත්පත තර්ක කරනු ලැබේ.

එමෙන්ම Chanel 4 ප්‍රධාන නිළිය ඉසප්‍රියා කොටි සාමාජිකාවක් බව ඒත්තු ගන්වමින් එම වීඩියෝ පටයේ ඇති පක්ෂපාතීත්වය දිනමිණ පුවත්පත විසින් විග්‍රහ කර ඇත. 1982 යාපනයේදී උපත ලබා ඇති ඇය පසුව කොටි සංවිධානයට බැඳී කොටි හඬ හා කොටි රූපවාහිනී සේවයේ නිල නිවේදිකාව වශයෙන් කටයුතු කර ඇති බව ප්‍රකාශ කරයි. මෙලෙස කරුණු කාරණා එකින් එකට පෙළ ගස්වමින් දිනමිණ පුවත්පත උත්සාහ ගෙන ඇත්තේ Chanel 4 වාර්තා චිත්‍රපටය අසත්‍ය චිත්‍රපටයක් බව ඒත්තු ගැන්වීමටය. මේවාට අමතරව Chanel 4 සිදුවීමත් සමඟම ශවේන්ද්‍ර සිල්වාගේ ක්‍රියා කලාපය ද වාර්තාකරණ අතර මෙම අභියෝගය හමුවේ අප මුහුණ දිය යුත්තේ කොහොමද? යන්න පිළිබඳව විදග්ධ කතිකාවක් දිනමිණ පුවත්පත ගොඩනැගීමට කටයුතු කර නොමැත. හුදෙක් Chanel 4 වාර්තා චිත්‍රපටය අසත්‍ය චිත්‍රපටයක් බව ඒත්තු ගැන්වීමට උත්සාහ කරන ලදී. එය ශ්‍රී ලංකා රජයේ ප්‍රතිරූපයට හානි කරවන්නක් බැවින් ඒ නිසා අප විරුද්ධ විය යුතුව වන තැන ඉඳගෙන ප්‍රවෘත්ති වාර්තාකරණයේ යෙදුණු ස්වරූපයක් දිනමිණ පුවත්පතේ දැකිය හැකිය.

මේ කෙසේ වෙතත් Chanel 4 නාලිකාව වාර්තා චිත්‍රපටය ඉදිරිපත් කිරීමත් සමඟම ආණ්ඩුව ඊට විරුද්ධව කටයුතු ගන්නා බව දිවයින, දිනමිණ හා ලංකාදීප යන පුවත්පත් තුනම වාර්තා කරනු ලැබුවේය. නමුත් එම ක්‍රියාමාර්ග මොනවාද? ඒවා කොතරම් සාර්ථක වූයේද? එහි ප්‍රතිඵල මොනවාද? යන්න පිළිබඳ පසු විපරම් කිරීමට මෙම පුවත්පත් තුනෙන් එකක්වත් උත්සාහ ගෙන නොමැති බවක් පෙනී යයි. Chanel 4 වාර්තා චිත්‍රපටය පිළිබඳව තොරතුරු වාර්තා කිරීමේදී ලංකාදීප පුවත්පත අනුගමනය කර ඇත්තේ ඉතාමත් මන්දගාමී ක්‍රියාකලාපයකි. දිනපතා පුවත්පත් තුළChanel 4 වාර්තා චිත්‍රපටය විකාශය වීම, ඊට රජයේ විරුද්ධභාවය ප්‍රකාශ කිරීම, විවිධ දේශපාලඥයින් එය තරයේ ප්‍රතික්ෂේප කිරීම ආදී ප්‍රවෘත්ති වාර්තාවන්ට අමතරව Chanel 4 වාර්තා චිත්‍රපටයේ අන්තර්ගතය, පිළිබඳව පුළුල්ව සාකච්ඡා කිරීමට ලංකාදීප පුවත්පත උත්සාහ ගෙන නැත. "නිව්යෝර්ක් නුවරදී

චැනල් 4 ට ශඩේන්ද්‍රගෙන් කනේ පහරක්" යන තේමාවෙන් සිරි හීන්පැල්ල රචිත වාර්තාව තුළින් Chanel 4 නාලිකාව අපහාසයට ලක් කර ඇත. විශේෂයෙන් ඊට උචිත වාග් කෝෂයක් භාවිතා කර ඇති බව එම වාර්තාව බැලූ කාටත් පැහැදිලි වේ. (ලංකාදීප, 2011.06.27, 07 පිටුව)

මෙහිදී විශේෂයෙන්ම ලංකාදීප පුවත්පත අනුගමනය කළ විශේෂ ක්‍රියාමාර්ගයන් කිහිපයක් දැකිය හැක. ඒවා දිවයින හෝ දිනමිණ යන පුවත්පත් දෙක තුළ දැකිය නොහැකි ලක්ෂණයන් වේ. ඉරිදා ලංකාදීප පුවත්පතේ පළ වන "එකම ප්‍රශ්නයට උත්තර තුනක්" යන විශේෂාංගය. විශේෂයෙන් එහිදී මහඟු කාර්යයක් ඉටු කරයි. එම විශේෂාංගය වෙන් වන්නේ එම සතියේ රටේ උණුසුම් ගැටළුව පිළිබඳව ප්‍රධාන දේශපාලන පක්ෂ 03 ක නියෝජිතයින් තිදෙනෙකු දරණ මතවාදය විමර්ශනය කිරීමයි. ආණ්ඩු පක්ෂය, විපක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ යන දේශපාලන ප්‍රවාහයන් හි මතවාදයන් සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම ලංකාදීප පුවත්පත විසින් කරනු ලැබේ. එමෙන්ම ලංකාදීප පුවත්පත "එතෙර පත්තර කියන කතා" යන විශේෂාංගය ද මෙහිදී ප්‍රධාන කොට සැලකිය හැක. මේ අනුව දරුස්මාන් වාර්තාවට සමගාමීව දිවයින හා දිනමිණ පුවත්පත ඒ වගේම ලංකාදීප පුවත්පත කතුවැකි, තීරු ලිපි හා විශේෂාංග ආදිය ප්‍රධාන මෙවලම් ලෙස යොදා ගෙන තොරතුරු සමාජානුගත කිරීම සිදු කරනු ලැබේ. ඒවා අතර,

| | |
|---|---|
| ❖ රජ වීදිය<br>❖ කාලීන සටහන | විශේෂාංග |
| ❖ උතුර දකුණ<br>❖ ඇති තතු<br>❖ කිල්ලෝටය<br>❖ මගේ දැකීම | තීරු ලිපි |

ප්‍රධාන ලෙස ගත හැකිය. ඒ අනුව පුවත්පතේ ආකෘතික බව වාර්තාමය කාර්යයේදී උපරිම ප්‍රයෝජන ගැනීමට ලංකාදීප පුවත්පත උත්සාහ ගෙන ඇත. නමුත් මීට සමගාමීව දිවයින පුවත්පත හා දිනමිණ පුවත්පත යොදා ගෙන ඇති ආකෘතික බව ඒකාකාරී වේ. එම පුවත්පත් දෙකම තීරු ලිපි යොදා ගන්නේ ඉතාමත් අල්ප වශයෙනි.

දිනමිණ පුවත්පත ද ඊට සමාන ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව පෙනේ. එනම් දරුස්මාන් වාර්තාවට විරුද්ධ වීමට වඩා බැන් කී මූන් ට විරුද්ධව ජනමතය මෙහෙය වූ බවක් පෙනේ. ඒ බව දිනමිණ කර්තෘ වාක්‍යය කිහිපයක ශීර්ෂය තුළින්ම තේරුම් ගත හැක.

"සාම දූතයාගේ නොනිමි මෙහෙවර" (දිනමිණ, 2011.04.22).

"සාම දූතයාගේ නව පරිවර්තනය" (දිනමිණ, 2011.04.23).

"මූන් මහත්තයාගේ දූන ගැනීම පිණිස" (දිනමිණ, 2011.04.26).

ආදී වශයෙන් දැක්වීමට පුළුවන. අනෙක් අතට දිනමිණ පුවත්පතේ ඇතැම් කර්තෘ වාක්‍ය මගින් අප ඉදිරියට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව තක්සේරු කිරීමක් ද සිදු කොට ඇත. නමුත් ඒවාට වඩා ප්‍රබලව නැගී සිටියේ ආණ්ඩුව මේ වන විට රැගෙන ඇති ක්‍රියාමාර්ගයන් පිළිබඳව ඉදිරිපත් කිරීමටය.

❖ කොටි ත්‍රස්තවාදීන් පුනරුත්ථාපනය කිරීම,

❖ උතුරු-නැගෙනහිර නැවත පදිංචි කිරීම,

❖ උතුරේ බිම් බෝම්බ ඉවත් කිරීම,

❖ අධි ආරක්ෂිත කලාප ඉවත් කිරීම

ආදී කාරණා මතු කර දැක්වීමයි. මෙසේ ප්‍රකාශ කිරීමෙන් දිනමිණ පුවත්පත උත්සාහ කළේ ආණ්ඩුව විසින් මෙවැනි ක්‍රියාමාර්ග රැගෙන තිබෙද්දීත් යුද අපරාධ කිරීමේ චෝදනාව ඉදිරිපත් කිරීම සාධාරණ නොවැති බවයි.

එවලේම ඇතැම් අවස්ථාවල පුවත්පත් කර්තෘවරු පෞද්ගලිකව දරණ මතය සිය පුවත්පත ඔස්සේ බෙදා හැරීමට අසමත් වූ බව ද දැකිය හැකිය. එහිදී විවිධ හේතු බලපාන බව පෙනේ. ඒවා අතර,

- ❖ මාධ්‍ය හිමිකාරිත්වය.
- ❖ දේශපාලන මතවාදය.
- ❖ මාධ්‍ය ප්‍රතිරූපය හා.
- ❖ ජාත්‍යන්තර බලපෑම්.

ආදී හේතුන් ප්‍රධාන වේ. මේ කෙසේ වෙතත් යුද අපරාධ පිළිබඳව ජාත්‍යන්තරයෙන් එල්ලවන බලපෑම හමුවේ පුවත්පත් මාධ්‍යය හැසිරීම යම් ආකාරයකට සිදුවූවත් ජාත්‍යන්තරයෙන් එල්ලවන බලපෑම් වෙනස් කිරීමට තරම් ප්‍රබල නොවූ බව කිව හැකිය.

**සමාලෝචනය**

මෙම අධ්‍යයනයට අනුව ජාත්‍යන්තරයෙන් එල්ලවන බලපෑම් වෙනස් කිරීමට දේශීය මුද්‍රිත මාධ්‍යයට පමණක් නොහැකිය යන්න සනාථ විය. ඒ අනුව ජාත්‍යන්තර න්‍යායය පත්‍ර වෙනස් කිරීමට දේශීය මුද්‍රිත මාධ්‍යයට නොහැකි බව ප්‍රත්‍යක්ෂ විය. එයට ප්‍රධාන හේතුව ජාත්‍යන්තර අභියෝගයකදී මාධ්‍ය කටයුතු කළයුතු ආකාරය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් පුවත්පත් මධ්‍යයට නොමැති වීමයි. අනෙක් අතට මාධ්‍ය හිමිකාරිත්ව යටතේ මාධ්‍ය යදම්වලින් බැඳී පවතී. මේ හේතු නිසා මාධ්‍ය වාර්තාකරණය පක්ෂපාති වේ. මාධ්‍ය හැසිරීම පිළිබඳව පිළිගත් න්‍යායය පත්‍රයක් දේශිය පුවත්පත් මාධ්‍ය සතු නොවීම ද මෙහිදී දැකිය හැකි ප්‍රබල ගැටළුවක් විය. ජාත්‍යන්තර මාධ්‍ය සමඟ පුළුල් සම්බන්ධතාවයක් දේශිය මාධ්‍ය සතු නොවීම ද මෙම ජාත්‍යන්තර මතවාද වෙනස් කිරීමට නොහැකි වීමට හේතු කාරණා ලෙස දැක්විය හැක. එමෙන්ම දේශිය මාධ්‍යයන්ට ආචාර ධර්ම පද්ධතියක් දක්නට නොලැබීම ද ප්‍රධානකොට සැලකිය හැකිය. මේ හේතුකොටගෙන එම දුර්වලතා නිවැරදි කර ගැනීමේ අවශ්‍යතාවය දේශීය මාධ්‍යයට පෙන්වාදීම අපගේ වගකීමක් වන්නේ ය.

**නිගමන**

- දැරුස්මාන් වාර්තාවට සමගාමීව දේශිය පුවත්පත් වාර්තාකරණයේ යෙදුණු බව අනාවරණය විය. එම ප්‍රවෘත්ති විග්‍රහාත්මකව ඉදිරිපත් කිරීමේදී පුවත්පත්වල හැසිරීම එකිනෙකට වෙනස් විය. එම වෙනස්වීම තුළ දිවයින පුවත්පත සෙසු පුවත්පත්වලට වඩා විග්‍රහාත්මකව ඉදිරිපත් කිරීම අතින් පෙරමුණ ගත් බව කිව හැකිය. එය පුළුල් සමාජ කර්යයක් උදෙසා පදනම් විය. දිනමිණ හා ලංකාදීප පුවත්පත් බොහෝවිට උත්සහ ගත්තේ ප්‍රවෘත්තිය වාර්තාකිරීමට පමණි.
- ජාත්‍යන්තර වශයෙන් එල්ලවන මතවාද වෙනස් කිරීමට දේශීය මාධ්‍යය පමණක් කළ නොහැකි බව මෙහිදී අනාවරණය විය. විශේෂයෙන්ම එහිදී දේශිය ජනමතය තුළ ශ්‍රී ලංකාවේ රජය යුද අපරාධ නොකළ බවට මතයක් ජනතා ගත කරමින් ජාත්‍යන්තරයෙන් එල්ලවන බලපෑමට විරුද්ධව කටයුතු කිරීමට ජනතාව පෙළගස්වන ලදී. නමුත් එම බලපෑම ජාත්‍යන්තරය වෙනස් කිරීමට ප්‍රමාණවත් නොවූ අතර ජාත්‍යන්තර මාධ්‍යය ඔවුන්ගේ න්‍යායය පත්‍රයකට අනුගතව සිය කටයුතු කරගෙන යනලදී.
- සමස්තයක් වශයෙන් යුද අපරාධ චෝදනාව හමුවේ මුද්‍රිත මාධ්‍යය තොරතුරු වාර්තා කිරීමේදී ප්‍රවෘත්ති පමණක් නොව කර්තෘ වාක්‍ය, විශේෂාංග, විචිත්‍රාංග ලිපි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ ලිපි මෙන්ම කාටූන් සහ විකට චිත්‍ර ද යොදා ගනිමින් සිය මතවාදය ග්‍රාහක ගත කිරීමට උපයෝගි කරගත්තේය.
- දැරුස්මාන් වාර්තාවේ අන්තර්ගතයත් සමඟ ඒ ඒ දේශපාලන පක්ෂය දරණ මතය එකිනෙකට වෙනස් විය. සමස්තයක් වශයෙන් සියලු දේශපාලන පක්ෂ ශ්‍රී ලංකාව යුද අපරාධ නොකළ බව පිළිගත්තත්, දැරුස්මාන් වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව විවිධ මත දරන ලදි
- දැරුස්මාන් වාර්තාවට විරුද්ධව ජනතාව පෙළගැස්වීමේදී මුද්‍රිත මාධ්‍ය උත්සහ ගත්තේ පෙළපාලි යාම, විරෝධතා ඉදිරිපත් කිරීම, බෝධි පූජා පැවැත්වීම ආදී ක්‍රියාකාරකම් වෙනුවෙන් ය. ඉන් ඔබ්බට ගිය නෛතික බලයක් සහිත ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීමේ අවශ්‍යතාවය වෙනුවෙන්

මුද්‍රිත මාධ්‍ය සංදේශයන් සකස් කළේ ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉතාමත් අඩු අගයකි.

- ජාත්‍යන්තරයෙන් අර්බුදයක් පැනනැගී ඇති අවස්ථාවක කටයුතු කළයුතු ආකාරය පිළිබඳව කිසිදු ජාතික ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකීය පුවත්පත් මාධ්‍යයට නොමැති බව නිගමනය කළ හැක. ඒ අනුව ඒ ඒ පුවත්පත කටයුතු කරනු ලැබුවේ ඒ ඒ ආයතනික අධිකාරිත්වය පදනම් කරගෙනය.
- මාධ්‍යය හරහා සන්නිවේදනය කරන බොහෝ තොරතුරු සහ පෙළඹවීම් මාධ්‍යය හිමිකාරීත්වයේ අරමුණු මත තීරණය වන නිසා ග්‍රාහකයන්ට තමන් හා තම අවට ලෝකය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීමට ඇති ඉඩකඩ ඇහිරී ගිය බව නිගමනය කළ හැක. මේ නිසා ලෝකයේ පවතින බොහෝ දැවැන්ත සමාජ ගැටළුවල යථාර්තය මේ නිසා සමාජ අවධානයෙන් ගිලිහී ඇතිවා සේම යුද අපරාධ පිළිබඳ ඇති චෝදනාව ද සමාජ අවධානයෙන් ගිලිහී යාමට පුළුවන.
- දරුස්මාන් වාර්තාවෙන් එල්ලවන චෝදනාවල සත්‍ය අසත්‍යතාවය කුමක්ද? යි ප්‍රත්‍යක්ෂ කර ගැනීමට ලංකාවේ මුද්‍රිත මාධ්‍යයට හැකි නොවුණු බව නිගමනය කළ හැක. මෙහිදී මාධ්‍ය බොහෝ විට කටයුතු කරනු ලැබුවේ ඒ ඒ දේශපාලන පක්ෂයේ නියෝජිතයෝ දරණ මතවාදය වාර්තා කිරීම පමණි. ඒ නිසා එම බරපතල ජාත්‍යන්තර චෝදනාවේ යථාර්තය අනාවරණය කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම, දැනුවත් කිරීම හෝ පෙළ ගැස්වීම ලාංකීය මුද්‍රිත මාධ්‍ය මඟින් සිදු නොවුණු නිසා මෙම මාධ්‍ය ක්‍රියාකාරිත්වය සමාජ ප්‍රගමනයට හේතු නොවන බව කිව හැක.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් එල්ලවන බලපෑම් හමුවේ මාධ්‍ය ක්‍රියාකළයුතු පොදු නිශ්චිත ආචාර ධර්ම පද්ධතියක් දේශීය මුද්‍රිත මාධ්‍යයට නොමැත.
- ලංකාවේ මුද්‍රිත මාධ්‍යය හුදෙක් සිදු වූ දෙයක් වාර්තාකරණය කිරීම විනා ගවේෂණාත්මක වාර්තාකරණයේ යෙදෙන්නේ ඉතාමත් අල්ප වශයෙන්ය.
- ඇතැම් පුවත්පත් ආණ්ඩුවට හෝ රාජ්‍යය නොවන සංවිධාන මත යැපෙන හෙයින් අපක්ෂපාතීත්වයෙන් කටයුතු කිරීමට හැකියාවක් නොමැත. එහෙයින් යුද අපරාධ චෝදනාවේදී ද මුද්‍රිත මාධ්‍යයට අපක්ෂපාතීව කටයුතු කිරීමට හැකියාවක් නොලැබුණි.
- දරුස්මාන් වාර්තාවට විරුද්ධව දේශීය වශයෙන් ජනතාව පෙළගැස්විය යුතු වුවත්, දේශීය මුද්‍රිත මාධ්‍යය සිදු කළේ වාර්තාවට විරුද්ධව ජනතාව පෙළගැස්වීම නොව බැන් කී මූන්ට විරුද්ධව ජනතාව පෙළ ගැස්වීමයි.
- ජාත්‍යන්තර අභියෝගයන් හමුවේ දේශීය මාධ්‍ය කටයුතු කරන ආකාරය පිළිබඳව පොදු න්‍යායය පත්‍රයක් දේශීය පුවත්පත් මාධ්‍යයට නොමැති බව නිගමනය කළ හැක.
- ඒ අනුව යුද අපරාධ සිදු වූ බවට ජාත්‍යන්තරයෙන් එල්ලවන බලපෑම් හමුවේ විද්වත් මණ්ඩලය සකසන න්‍යාය පත්‍ර වෙනස් කිරීමට දේශීය මුද්‍රිත මාධ්‍යයට හැකියාවක් නොලැබුණු බව නිගමනය කළ හැක.

**යෝජනා**

- මුද්‍රිත මාධ්‍යය හුදෙක් ප්‍රවෘත්තිය ඉදිරිපත් කිරීමට අදාලව, ප්‍රවෘත්තිමය වටිනාකම අනුව එම ප්‍රවෘත්තිය විග්‍රහාත්මකව ඉදිරිපත් කිරීම කෙරෙහිද වැඩි නැඹුරුවක් යොමු කළ යුතුය.
- දේශීය මාධ්‍යය, විදේශිය මාධ්‍යය සමඟ පුළුල් ව පැතිරුණු සම්බන්ධතා ජාලයක් පදනම් කර ගත යුතුය.
- සැම විටම අපක්ෂපාති වාර්තාකරණයක් වෙනුවෙන් මාධ්‍යය කටයුතු කළ යුතුය.
- ජාත්‍යන්තර අභියෝග හමුවේ දේශීය මාධ්‍යය කටයුතු කරන ආකාරය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.

- කාලීන ගැටලුවක් පිළිබඳව මාධ්‍යය කතිකාවතක් ගොඩනගා ගැනීමේදී එහි දේශපාලන පැතිකඩ පමණක් නොව සමාජීය, ආර්ථික, සංස්කෘතික, ආගමික පැතිකඩවල් කෙරෙහි ද අවධානය යොමු කිරීම.
- ජාත්‍යන්තර අභියෝග හමුවේ දේශීය මාධ්‍යය හැසිරිය යුතු ආකාරය පිළිබඳව පොදු ආචාර ධර්ම පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.
- මාධ්‍යවේදීන් හා මාධ්‍යය, මාධ්‍යය ආචාර ධර්ම මත පදනම්ව කටයුතු කිරීමේ වටිනාකම පෙන්වාදීමේ වීධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම.
- මාධ්‍යයකරණය තුළ ගවේෂණාත්මක වාර්තාකරණය පුළුල් කිරීම.
- දේශීය මාධ්‍යයන් ජාත්‍යන්තර අභියෝග හමුවේ පොදු න්‍යායය පත්‍රයකට අනුගත කිරීම.
- විදේශයෙන් එල්ලවන තර්ජන හමුවේ ක්‍රියාකළයුතු ආකාරය විමර්ශනය කිරීමට විධිමත් පර්යේෂණ කමිටුවක් පත් කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- අගලකඩ, අජන්ත කුමාර සහ කස්තුරිල රන්ජන්. (2011). මූන්ගේ උපදේශන කමිටු වාර්තාව. ලංකාදීප, මැයි 04, පිටුව 01.
- අගලවත්ත, එස්. මඩවල. (2011), දරුස්මාන් වාර්තාවට එරෙහිව විමට මහ ඇමති සමුළුව ඒකමතිකව එකඟවෙයි. ලංකාදීප, මැයි 05, පිටුව 10.
- අඥාත කර්තෘ. (2011). බෑන් කී මූන් පත් කළ උපදේශන කමිටුවේ වාර්තාව. ලංකාදීප, අප්‍රේල් 28, පිටුව 14.
- අඥාත කර්තෘ. (2011). වාර්තාවක් සකස් කරන්නට නෛතික බලයක් දරුස්මාන් කමිටුවට නැහැ, දිනමිණ, මැයි 04, පිටුව 07.
- අබේරත්න. අමිල. (2011), චැනල් ෆෝ දෙකක් පරීක්ෂා කරනවා, දිවයින, ජූනි 18, පිටුව 06.
- අබේසුන්දර, මහින්ද. (2011). ඒකපාර්ශවික වාර්තාවක්, දිනමිණ, මැයි 05. පිටුව 04.
- අබේසුන්දර,මහින්ද. (2011), ජාත්‍යන්තරයට ඇත්ත කියන්න ආණ්ඩුවෙන් වාර්තා දෙකක්, දිනමිණ. ජූනි 29, පිටුව 01.
- ගම්මන්පිල, උදය ප්‍රභාත්. (2011), මූන් කමිටු සාමාජිකයන්ගේ අඳුරු ඉතිහාසය, ලංකාදීප, අප්‍රේල් 28, පිටුව 11.
- ගුණවර්ධන, උදිත. (2011)ලඑල්.ටී.ටී.ඊ.යේ ඝාතන ගැන අවුරුදු 05ක් චිත්‍රපට පෙන්වන්න සූදානම්, දිනමිණ, ජූනි 04, පිටුව 06.
- ගුණසේකර. තිසරණී. (2011), දරුස්මාන් වාර්තාවේ ඇත්ත නැත්ත, ලංකාදීප, මැයි 04, පිටුව 02.
- ජයරත්න, පුෂ්පකුමාර. (2011), විදේශ බලවේග කිහිපයක් අපේ රටේ සිවාධීනත්වයට බලපෑම් කිරීමේ කුමන්ත්‍රණයක නිරත වී සිටිනවා. ලංකාදීප, අප්‍රේල් 26, පිටුව 05.
- ජයරත්න, පුෂ්පකුමාර. (2011), ශ්‍රී ලංකාව අස්ථාවර කිරීමේ වෑයමක්, ලංකාදීපල අප්‍රේල් 28. පිටුව 05.
- ජයවීර, චන්දන. (2011), වාර්තාවට එරෙහි ලෝක ජනමතයක් ඕනෑල දිනමිණ, මැයි 02, පිටුව 08.
- ඩීන්ල තාලිෆ්. (2011), දරුස්මාන් කමිටු වාර්තාව ප්‍රසිද්ධ කරයි, ලංකාදීප, අප්‍රේල් 27, පිටුව 01.
- පතිරණ, මහින්ද. (2011), ජාතික අභියෝග හමුවේ ශ්‍රී ලාංකිකයාගේ කාර්යභාර්යය, දිවයින, ජූනි 25, පිටුව 08.
- වර්ණකුලසූරිය, කීර්ති. (2011), කොටි යුද අපරාධ කරුවන්ට ජිනීවා එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දොර විවෘත වේ, දිවයින, ජූනි 12, පිටුව 22.
- වර්ණකුලසූරිය, කීර්ති. (2011), කොටි සහ චැනල් ෆෝ එක් වී ජිනීවාහිදී දියත් කළ කුමන්ත්‍රණය, දිවයින, ජූනි 17, පි 10.
- වර්ණකුලසූරිය, කීර්ති. (2011). යුද අපරාධ කරුවන් ශ්‍රී ලංකාවට එරෙහිව හඬ නැගීම, දිවයින, ජූනි 18, පිටුව 11.
- වර්ණකුලසූරිය, කීර්ති. (2011), චැනල් ෆෝ වීඩියෝ පටය නිර්මාණය කළේ කෝරළයේ. දිවයින, ජූනි 18, පිටුව 06.
- වර්ණකුලසූරියල කීර්ති. (2011)ලයුද අපරාධ ගැන ඉන්දියාව හඬ නැගීමේ පිහිළිව, දිවයින, ජූනි 20, පිටුව 12.
- වර්ණකුලසූරිය, කීර්ති. (2011). චැනල් ෆෝ කොටි කොන්ත්‍රාත්තුව. දිවයින, ජූනි 16ල පිටුව 12.
- විතාන, ශාන්ත කුමාර. (2011). බෑන් කී මූන්ට නොපෙනුණ අනුරපුර ඝාතනය. ලංකාදීප. මැයි 01, පිටුව 16.

- හින්පැල්ල, සී.ටී. (2011), නිව්යෝර්ක් නුවරදී වැහල් පෝට් ශවේන්ද්‍රගෙන් කම ණ් පහරක්,ලංකාදීප, ජූනි 27 පිටුව 10.
- http://www.divaina.com/2011/01/04/news31.html&
- http://www.divaina.com/2011/04/18/news 06.html
- http://www.divaina.com/2011/04/20/news16.html
- http://www.divaina.com /2011/04/20/ news04.html
- http://www.divaina.com/2011/04/22/news26.html
- http://wikalpa.org/.?p=6406
- http://www.lankatryth.com
- http://vikalpa.org

## පනත් කෙටුම්පත්

- අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව (1998), ශ්‍රී ලංකාව මානව හිමිකම් කොමිෂන් සභාව. මූලාශ්‍ර
- අනුර කුමාර දිසානායක. පාර්ලිමේන්තු මන්ත්‍රීල 2011. 08. 25. පක්ෂ කාර්යාලයේදීල ඉසුරුපාය.
- ආරියනන්ද දොඹගහවත්ත, කර්තෘල 2011. 08. 31. විජය පුවත්පත් සමාගම.
- එස්. ජී. පුංචිහේවා, නීතිඥල 2011.09.01, 1149ල කෝට්ටේ පාරල රාජගිරිය.
- කීර්ති වර්ණකුලසූරිය, කර්තෘල 2011. 08. 27, උපාලි පුවත්පත් සමාගම.
- ජගත් ලියනආරච්චිල නීතිඥල 2011.09.01ල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.
- ප්‍රතිභා මහනාමල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යල නීතිඥල 2011.09.01ල කොළඹ විශ්වවිද්‍යාලය.
- මහින්ද අබේසුන්දර, ප්‍රධාන කර්තෘල 2011. 09. 03, ලේක්හවුස් ආයතනයේදී
- මොහාන් සමරනායක, සභාපතිල 2011.09.08. රූපවාහිනී සංස්ථාව.
- වික්ටර් අයිවන්, ප්‍රධාන කර්තෘ, 2011. 08. 30, රාවය පුවත්පත් සමාගම.